# ලෝකාන්තයෙන් පසු

කටුක අත්දැකීම් හේතුකොටගෙන
නිසරු මගකට යොමුවන කාගේ හෝ
යුග දිවිය නිසිමගකට ගෙන ඒමට මින්
පිටුවහලක් ලැබේද, මෙය ලිවීමෙන් මා
බලාපොරොත්තුවන පරමාර්ථය ඉන්
ඉටුවේ!

හිඹුටානේ
ජයසිරි විජේරත්න
2022

# හැඳින්වීම

මෙහි මුල් කොටස ලෙස සැලකියහැකි **"ලෝකාන්තය"** නමැති අපගේ ආදර කතාව ඉතා සුමිහිරි අත්දැකීම් වලින් ගහන වුවත් **"ලෝකාන්තයෙන් එහා අන්තය"** ඉතා අමිහිරි අත්දැකීම් වලින් පරිපූර්ණ වේ. මෙම කෘතීන් දෙකේම සංකලනයක් ලෙසද, සාරාංශයක් ලෙසද **"ලෝකාන්තයෙන් පසු"** සැලකියහැකිය.

පටුන

පිටු අංකය


4 - චාරිකාව, පළමු බත්පත

5 - හෙලිදරව්ව, යුගදිවිය, සිමෙන්ති පොළව කඩා දැමීම

6 - ප්‍රථම පොලිස් පැමිණිල්ල, නයිජීරියා ගමණ, අස්තථාන සැකය, නයිජීරියාවේ සිට හදිසියේ ආපසු පැමිණීම

8 - පාස්පෝට් නැතිවීම, පොට් ගැලවීම, මාව ලදාස්තර ළඟට ගෙනයාම

9 - කාලී යක්ෂාරූඪය, පත්තිනි නැටුම

10 - සූනියන් කැපීම, ගඟේ නාඩගම, මලයාලි කම්බි ගුරුකම්

11 - පෝලන්ත වෛද්‍යවරිය හමුවීම, මෝටර්රථය දන්දීම

12 - බරපතල අග-හිඟ කම්, මංගල මුද්ද විකිණීම, පුරුදු රැකියාව නැවත ලබාගැණීම, කුසුම් ගෙදරින් පිටවීම, ආපසු පැමිණීම - පළමුවරට සමාව ගැණීම, පොලීසියෙන් පැමිණීම

14 - සාම සාකච්ඡා - 2වැනි වරට සමාව ගැණීම, සුමිත්‍රයෝ

15 - බණ්ඩාරවෙල ගමණ, ටැක්සි රියැදුරන් ඉදිරිපිටදී අපහාස කිරීම, ඒඩ්ස් සැකය

16 - මා ගෙදර හැරයාම, දෙවැනි වරට ගෙදර හැරයාම, ආපසු ගෙදර ඒම

17 - ළමා හා කාන්තා අංශගේ පැමිණිල්ල, මො කෙරෙහි පුතාගේ සිත බිඳවීම, මට වැරදුන තැන, විශ්‍රාම වැටුප අහිමි වීම, රේස් දැමීම

18 – 2013 ජනවාරි 22, මැයි 12, ඔක්තෝබර් 17, 18

19 – 3 වැනි වරට සමාව ගැණීම, 2014 ජනවාරි 15, 27,නොවැ 14,22, සසර ගමණ

20 – 2015 අගෝස්තු20,26, 2017 සැප්තැම්බර්, ඔක්තෝබර් 1

21 – 2017-ඔක්තොබර් 12, 2018 ජනවාරි 4, මාර්තු 25, අප්‍රියෙල් 18

22 - 2018 මැයි1, 2018 අගෝස්තු 24, සසර පැතුම, ප්‍රබලතම කර්ම විපාකය

23 - ගරු සැලකිලි, 2021 නොවැ 24, මාගේ ප්‍රාර්ථනය

## වාරිකාව

සරසවි දිවියේ අවසාන වසරේ මුල්වාරය තුල, කලා අංශයේ ශිෂ්‍ය සංගමයක් වන ගාන්ධර්ව සභාව මගින් ලොකාන්ත වාරිකාවක් සංවිධානය කරඇති බව ඊට පෙරදින මට දැනගන්නට ලැබුනි. පළමු වසරේ සිට විජේවර්ධන ශාලාවේ විසූ මිතුරන් වන වි.මු.පොඩිබන්ඩා සහ ආර්.ඒ විජේරත්න, මා හමුවී "වරෙන් බං යන්න අවුරුදු දෙකක් වේලි වේලි හිටිය මදෑ කෙල්ලෙක්වත් සෙට් කරල දෙන්නම්" යයි කීය. ආර්.ඒ.විජේරත්නගේ කීම අනුමත කළ පොඩිබන්ඩා "අර කෙට්ටු කෙල්ල කුසුම් නම් විජෙයට ගැලපෙනව නේද?" යයි කීවේය. විනෝද වාරිකාවලට මගේ එතරම් ඇල්මක් නොතිබුනෙන්ද, ඔවුන්ගේ විහිළු තහළු කවදත් ඇසෙන සුපුරුදු කතා නිසාද, මා එතරම් ගනන් ගත්තේ නැත. පසුව කතාවට හවුල්වූ පළමු වසරේ රූමාවන (room mate) ගුණසේකරද ඇවිටිලි කළවිට පසුදා ගමණට සූදානම් වූයෙමි.

## පළමු බත්පත

මධ්‍යාහ්නය පසුවනවිට මිනිස් වාසයෙන් ඈත, ලෝකාන්තයට පිවිසෙන මගට ළඟාවිය. මහමග ඉන් අවසන්වේ. ඉන් එහාට රථවාහන යාම අසීරුය. හැමෝම බස්රියෙන් බැස සිසිල් සුන්දර වනපියසෙන් හෙබි පරිසරය නරඹමින් ගිමන් හරින අතර, සංවිධායකයින් දිවා ආහාර පාර්සල් සහිත පෙට්ටියද රැගෙන, ආහාර ගැණීමට සුදුසු තැනක් සෙවීමේ නිරතවිය. හොඳින් තණකොළ වැවී ඇති තැනිතලා තුරු සෙවනෙහි තැබූ පෙට්ටියෙන් පාර්සල් එක එක රැගෙන කවුරුකවුරුත් බිම වාඩිවී ආහාර ගැණීම ආරම්භවිය. මා සාමාන්‍යයෙන් පෝලිම් වල සිටීමට අකමැතිය. එබැවින් අවට කැලෑවේ සිරි නරඹමින් සිට, සුපුරුදු ලෙස කලබලකාරයින්ට ඉඩ දී පෝලිමේ අන්තිමටම එක්වී, මගේ වාරය පැමිණිවිට, මා දෙස බැලූ ඈ "හානේ ඔයා ගත්තෙ නැද්ද?, මේ අන්තිම එකනෙ මං ගත්තෙ,..... එන්න මේකෙන් බාගයක් ඔයා ගන්න" යයි කීවාය. මා මොහොතකට ගොළුවිය. වෙන නැද්ද කියල අහන්නත් බෑ,...මේ ළමය දෙන්න හදනකොට එපා කියන්නත් බෑ,.....බෙදාගෙන කන්න පිඟන් ඇත්තෙත් නෑ,...ගැණුළමයෙක් එක්ක එක බත්පත කන්නත් ලැජ්ජයි,....අඳුනන්නෙත් නෑ,....දැක්කෙත් අදමයි,...මා එක මොහොතකට ප්‍රශ්ණ ජාලයකට මැදිවිය. " කමක් නෑ ඕන කෙහෙල්මලක් වුනාවෙ, හිත හොඳින් කතාකළ එකනෙ" යයි සිතූ මා ඈ අසලින්ම වාඩිවුනෙමි. එසේ ආහාර ගන්නා අතර "අන්න බං අරුං දෙන්න එක බත්එක කනව" ......"අනේ අනේ අපිටත් හොරෙන්ම සැට්වෙලා නේද?" ...... "ඕකෙ නම් පුතෝ හොරෙයක් තියනව"......"මං කිව්වෙ නැද්ද විජේට කුසුම් තමයි ගැලපෙන්නේ කියල"......යනාදී නොයෙක් කතා වටින් පිටින් ඇසෙන්නටවිය. ඊයෙ රෑ පොඩිබන්ඩ කිව්ව කුසුම් මෙයා නේද යයි සිතුනේ මෙවිටය. බස්රියේදි වරක් නෙතට-නෙත ගැටුනෙත් මෙයා නේද, ගම්පොළදි සපත්තු කඩයක් හෙව්වෙත් මෙයා නේද යයි සිතුනි. මේ හැම එකක්ම අහම්බෙන් සිදුවිය හැකිද, මෙතෙක් වේලා එතරම් ගණන් නොගත්තද, ඔවුන්ගේ විහිළු තහළු යටි සිතේ හොල්මන් කරන්නටවිය. පොඩිබණ්ඩා විහිළුවටමෙන් කී කතාව ඇත්ත වෙයිද යනාදී නොයෙක් සිතුවිලි මැද ආහාර ගැනීමට සිදුවිය.

අමතක නොවන ඒ බත්පත අනුභව කළ පසු මසිත නොසන්සුන් බව මටම හැඟුනි. ඇගේ යෙහෙලියන්වන ටිකිරි හා ස්වර්ණා ඈ දෙසත් මා දෙසත් හෙලූ බැල්ම මට තවමත් මැවී පෙනේ. "අපේ සුභපැතුම් මෙන්න" යයි කියන්නාක් මෙනි. අප යම් යම් දේ ගැන කතා කලද එතරම් මාතෘකා නොමැතිවිය. ඇගේ යෙහෙළියන්ව මට හඳුන්වා දුන්නත් මට හඳුන්වා දෙන්න කිසිවෙක් නැත. මගේ මිතුරන් හැමෝම ඇගේද මිතුරන් වීම ඊට හේතුව විය. (ඒ සියල්ලන්ම කලාපීඨයේ සිසුන් වූ අතර, විද්‍යා පීඨයෙන් සිටියේ මා පමණි.)

දිවා භෝජනයෙන් පසු සියල්ලෝම පා ගමන් ඇරඹූ අතර අප ක්‍රමයෙන් තවතවත් ළංවිය. නොයෙක් දේ කතා කළෙමු. දැන් දැන් මාතෘකාද වැඩිවෙමින් පවතී. තුරු සෙවනේ කඳුබෑවුම ඉහළට පා නගන අතර, ගුණේ, ස්වර්ණා හා ටිකිරි තරමක් දුරින් හෙමින් හෙමින් පියනැගුහ. කීපවරක්ම ඇය, ඔවුන්ට අඬගැසූ නමුත් ඒ බොරුවට බව මට සිතුනි. ඔවුන්ද අප අසලට ළං නොවූයේ ඕනෑකමින්ම අප

දෙදෙන තනි කිරීමට බව මට කීපවරක්ම සිතුනි. සැහෙන දුරක් පයින් ගමන්කර ලෝකාන්ත තැනිතලාවට අපි ළඟාවීමු.

ලා හිරුරැස් බැසයන සිසිල් පරිසරය තුල පහලින් පෙනෙන පාතාලය අපි නැරඹීමු. මීදුම සහ වලාකුළු අතරින් පහළින් පෙනෙන බලංගොඩ ප්‍රදේශයේ මහා මාර්ග, පෙනුනේ ගුවන් යානාවක සිට බලනවිට පහළින් පෙනෙන දර්ශණයක් ලෙසිනි. කෙතරම් චමත්කාර දර්ශණයක් වුවද, පාතාලය අසලට යාමට ඇය බිය වූයෙන් මගේ අතින් අල්ලාගෙන ඒ දර්ශණය නැරඹුවාය. මාද, ඇගේ අත හොඳින් අල්ලාගෙන වැඩිපුර අයිනට නොගොසින් සිටි අතර ජීවිතයේ මුල්වරට ගැහැණු ළමයෙකු අතින් අල්ලාගෙන සිටීම පිළිබඳව මට මා ගැනම පුදුම සිතුනි. මේ නම් අහම්බෙන් සිදුවූවක් නොව පෙරසිට පතාගෙන ඒමක් යයි සිතුනි. අප හඳුනාගෙන පැය කීපයකින් මෙතරම් ළංවීම කොතරම් පුදුමද, මගේ අනෙක් මිතුරන්ට නම් එය විශ්වාස කරන්නත් බැරි වේවි. මේ ආදී නොයෙක් සිතුවිලි මැද අනෙක් මිතුරු මිතුරියන්ද සමග ආපසු ගමන් ඇරඹුයේ හිරුබැසගිය පසුවය.

## හෙළිදරව්ව

සරසවියේ මීලඟ නිවාඩුවට ගෙදර පැමිණි පසු පළමුව කළේ අපේ ආදර කථාව හෙලිකිරීමයි. මා කුඩාකල සිට අද දක්වාම සිටින මගේ කල්‍යාන මිත්‍රයින් දෙදෙනා වනුයේ නංගි සහ පුංචිඅක්කාය. පළමුව මෙම රහස හෙලිකලේ ඔවුන් දෙදෙනාට පමණි.

## යුග දිවිය

අපගේ සම්බන්ධතාවය පිළිබඳ තොරතුරු කුසුම්ගේ පියාට හෙලි කළ පසු ඒ ගැන සාකච්ඡා කිරීම සඳහා දිනක් මම ඇගේ නිවසට ගියෙමි. ඉන්පසු ඇගේ පියා සහ පුංචිතාත්තා අප නිවසට චාරිත්‍රානුකූලව පැමිණ මගේ දෙමවුපියන් සමග සාකච්ඡා කරන ලදී. මගේ දෙමව්පියන්ද චාරිත්‍රානුකූලව එහි යාමට අදහස් කළ නමුත්, ඔවුන් එහි ගියහොත්, අපේ විවාහයට විරුද්ධ වේවිද යන බිය නිසා උපායශීලීව එය වැලැක්වීමි. දුර ගමණක් නිසා වැඩිපුර වියදම් කිරීම තේරුමක් නැති බවද අවබෝධකරදී විවාහය ලියාපදිංචි කිරීම සඳහා යාමට මගේ දෙමව්පියන්කැමති කරවා ගතිමි. ඒ අනුව වර්ෂ 1971 නොවැම්බර් 24 වැනි බුද දින, කෑගල්ල සල්ගාදු හෝටලයේදී මංගල පෝරුව මතදී, අපි චාරිත්‍රානුකූලව එක් වීමු. නිවසට පැමිණීමේ උත්සවය අප පදිංචි නිවසේදී (පුංචි අක්කලගෙ නිවස) නොවැම්බර් 28 වැනිදින පැවැත්වින. උත්සව කටයුතු චාම් ලෙස ඉතා හොඳින් සතුටින් නිමාවිය.

වැඩිකල් නොයවාම සුළු සුළු ආරවුල් ඇතිවිය. කිසිම හේතුවක් නැතිව මා කෙරෙහි යම් යම් සැක සංකා ඇති කරන බව පෙනෙන්නට තිබීම මට මහත් සිත් තැවුලට හේතුවිය.

## සිමෙන්ති පොළව කඩා දැමීම

අපේ ගේ හදන කාලයේ එහි සෑම කටයුත්තක්ම මා විසින් පෞද්ගලිකව අධීක්ෂණය කළා පමණක් නොව බොහෝ වැඩ දහඩිය මහන්සි නොබලා මා විසින්ම කරන ලදී. නාන කාමරය සහ වැසිකිලිය සාදනවිට ජිනදාස බාස්උන්නැහැ , වැසිකිලියේ බිම පඩියක් මෙන් නොසාදා වතුර හොඳින් බැසයන අයුරු ඉතා හොඳින් නිමකර තිබුනි. කුසුම් ගෙදර පැමිණි විගස අලවංගුවක් ගෙන බිම කඩන හඬක් ඇසී මා ගොස් විමසූවිට කීවේ බිම පඩියක් මෙන් සාදා නැති බැවින් එය කඩා නැවත සෑදියයුතු බවයි. මට තරහ ගිය නමුත් කළහැකි දෙයක් නොවූයෙන් ඇයට දොස් පවරා නිශ්ශබ්ද වූයෙමි. බාස්උන්නැහෙටද ඇගේ ක්‍රියාව ගැන බොහෝ හිත් වේදනා ඇතිවිය.

මෙය සිදුවී පහලොස් වසරකට පමණ පසු දිනක් අතරමගදී හමුවූ ජිනදාස බාස්උන්නැහැ සැපදුක් කතාකරමින් "නෝන එහෙම සණීපෙන් ඉන්නවදැයි" විමසූවිට මා කීවේ "සණීපෙන් නම් ඉන්නව, හිතුවක්කාරකම් නම් ඉස්සර වගේමයි" යනුවෙනි. එවිට ඔහු මෙසේ කීවේය. "මහත්තයො ඉවසිමෙ වුනත් සීමාවක් තියෙන්න ඕනැ, ඔය ගෑණි ඔහොම වුනේ මහත්තයගෙම වරදින්, එදා කණ හරහ පාර

දෙකක් ගැහුව නම් අද ඕහොම වෙන්නෙ නෑ......අනේ අම්මප මගෙ ගෑණියෙක් නම් මම එදා ගහන්නෙ පොල් පිත්තකින්." ඔහුගේ කතාව සම්පූර්ණයෙන්ම මම අනුමත කළෙමි.

## ප්‍රථම පොලිස් පැමිණිල්ල

අපගේ විවාහයෙන් වසර කීපයකට පසු දිනක් ශ්‍රී ලංකා ආධුනික ගුවන්විදුලි සංගමයෙන් (Radio Society of Sri Lanka - RSSL) පවත්වනු ලබන තරඟයකට (Direction Finding contest) මම සහභාගි වූයෙමි. එය ආරම්භ වූයේ සැන්දෑවේ 6 ට කොළඹ නිදහස් චතුරශ්‍රයෙනි. අවසන් වූයේ මැදියම් රාත්‍රියේදී පාදුක්කේදීය. මේ සඳහා මා පිටත්වන විට කුසුම් මා සමග අමනාපයෙන් සිටි බැවින් ඇය සමග කිසිවක් නොකියා, තාත්තට පමණක් ඒ ගැන පවසා මා ආපසු එන්නේ මැදියම් රාත්‍රියේ බවත් පැවසුවෙමි.

රාත්‍රී 1ට පමණ මා මෝටර් සයිකලයෙන් පැමිණෙන අතර නිවසට මී 100ක් පමණ දුරදී පොලිස් නිලධාරීන් දෙදෙනෙක් මාව නවතා ප්‍රශ්ණ කරනලදී. මා යාමට පෙර ගෙදරට කීවේ නැහැ නේද යයි ඔවුන් විමසූවිට, මා භාර්යාාවට කිසිවක් නොකී බවත් තාත්තට පමණක් පැවසූ බවත් කීවෙමි. එවිට ඔවුන් කියාසිටියේ හැන්දෑවේ මගේ භාර්යාාව පොලිසියට පැමිණ, පැමිණිල්ලක් කළ බවය.

## නයිජීරියා ගමණ

බොහෝ අය විදේශ රැකියා වලට යාමේ **උණක්** එකල පැවතින. කුසුම්ටද එය බෝ වී ඇති නිසා නිතර නිතර මට ඇවිටිලි කළ අතර, මගේ දෙමවුපියන්ගේ අවසාන කාලයේ ඔවුන් තනිකර දමා යාම කිසිසේත් කළ නොහැකි බව පවසා එය ප්‍රතික්ෂේප කළෙමි. මගේ දෙමවුපියන්ගේ අභාවයෙන් පසුනැවතත් ඇවිටිලි කරන්නට වූයෙන් ගුරු වෘත්තිය සඳහා නයිජීරියාවට යාමට තීරණය කළෙමි.

## අස්ථාන සැකය

මා නයිජීරියාවේ සිටියදී සෑම සතියකම කුසුම්ට ලිපියක් (සමහරවිට දෙකක්) එවීමට අමතක නොකළෙමි. මම කරන කියන සෑම දෙයක්ම ඇයට ලිව්වෙමි. රාජකාරි වැඩ සහ බැංකු කටයුතු සඳහා සතියකට දිනක්වත් සොකොටෝ (කි.මී.114ක්) යායුතුව තිබුනි. හැකි සෑමවිටකම මා ගියේ මගේ මෝටර් රථයෙනි. (SO-5014-SB, VW-1500) තලතා මෆාරාභි, අප විදුහලේ පිරිමි ගුරුවරු දෙදෙනෙක්ද, බාලිකා විදුහලේ ලාංකික ගුරුවරියන් තිදෙනෙක්ද සේවය කරන ලදී. බොහෝවිට ඒ අයගෙන් එක් අයෙක්වත් මා සමග යාමට එක් විය. ඒ හැම දෙයක්ම කුසුම්ට ලීවෙමි. මා කළ ලොකුම අණුවනකම එය බව මට අවබෝධ වූයේ, ඇය මා වරදවා තේරුම් ගත් බව දැනගත් පසුවය.

මා බලපත්‍ර ලත් ආධුනික ගුවන්විදුලි ශිල්පියෙක් බැවින් බොහෝ දිනවල ලංකාවේ වෙසෙන කීපදෙනෙක් සමග සන්නිවේදනය කිරීමේ පුරුද්දක් විය. මගේ නිවසේ විදුලිය නැති දිනවල, පෘතුගීසි ජාතික "අරඋෂෝ" ගේ නිවසට ගොස් ඔහුගේ ට්‍රාන්සීවරය භාවිත කරන ලදී. දිනක් වෛද්‍ය ජයන්ත නානායක්කාර (4S7DJ) කථාකර, කුසුම් මා ගැන අස්ථාන සැකයක් ඇතිකරගෙන සිටින බවත්, නයිජීරියාවේ වෙසෙන ලාංකික කාන්තාවක් සමග මා අනියම් සම්බන්ධයක් ඇතිකරගෙන සිටින බවට සැකයක් හටගෙන ඇති බවත් තවදුරටත් දැන්වීය.

## හදිසියේ ආපසු පැමිණීම

දිනක් (1982 ජූලි 29) ඉන්දියානු ජාතික ආනන්ද (VU2RYL) සමග මා රේඩියොවෙන් කථාකරන විට කුසුම්ගේ අසණීප තත්වය උත්සන්න බව දැනගතිමි. ඔහු කියා සිටියේ ලංකාවේ ජෝන් අමරතුංග මහතා (4S7JA)සහ තවත් කීපදෙනෙක් ඒ ගැන කථාකරනු ඔහු අසා සිටි බවත්, සංඥා දුර්වල බැවින් ඔහුට කෙලින්ම සම්බන්ධවිය නොහැකි වූ බවත්, කෙසේ හෝ මෙම පණිවිඩය මා වෙත ලබාදියයුතු බවත්, ජෝන් විසින් පවසා ඇත. මේ දිනවල සංඥා දුර්වල නිසා ලංකාවේ කිසිවෙක් සමග සම්බන්ධ වීම දුශ්කර විය. එබැවින් මට රේඩියෝවෙන් හමුවන විවිධ රටවල අය හැමෝම සමග, **"ඉදිරි දින කීපයතුල ග්‍රී.මා.වේලාවෙන් 12:45ට මෙග හර්ට්ස් 21.200 සංඛ්‍යාතය ඔස්සේ ලංකාවේ කවුරුන් හෝ**

**ඇමතීමට මා සූදානම්ය**" යන පණිවිඩය ප්‍රචාරය කළෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස අගෝස්තු පළමුවැනි දින (දෙදිනකට පසු) ඉහත කී වේලාවට මා විසින් ජෝන් ඇමතූ නමුත් සන්නිවේදනය කළ නොහැකි විය. නමුත් එය ශ්‍රවනය කළ නෙදර්ලන්ත ජාතික "බිල්" (PA3AWQ) ඊට ප්‍රතිචාර දක්වමින් කියා සිටියේ, 4S7JA, ජෝන්ද මෙම සංඛ්‍යාතයේ මා අමතමින් සිටින බවත් තමාට අප දෙදෙනාම ඉතා හොඳින් ශ්‍රවනයවන බවත්ය. ඒ අනුව ජෝන්ගේ පණිවිඩය මම "බිල්" හරහා ලබා ගතිමි. ජෝන් කීවේ, කුසුම් බලවත් ලෙස මානසික රෝගයකින් පෙලෙන බැවින් හැකි ඉක්මනින් මා ලංකාවට පැමිණියයුතු බවත් වෙනත් විකල්පයක් නැති බවත්ය. ඒ අනුව මම ක්ෂණික තීරණයක් ගතිමි. හැකි ඉක්මනින් ලංකාව බලා පිටත්වීමට තීරණය කළ මම, ඒ බව බිල් හරහා ජෝන්ට දැනුම් දුන්නෙමි.

නමුත් මගේ හිතවතුන් ගණනාවක්ම කීවේ, විදේශ මුදල් නොමැතිව, ප්‍රවේශ පත්‍රය සනාථ කරනොගෙන ඔය ගමණ යා නොහැකි බැවින් කල්දමන ලෙසය. නමුත් මට එය කළහැකි බවට ආත්ම ශක්තියක් තිබුනි. පසුවදාම අතින් ගෙවා, ගුවන් ටිකට්පත් ලබාගත් නමුත් ආසන වෙන්කරගැණීම සහ විදේශ මුදල් ගැණීමට සති දෙකක්වත් අවශ්‍ය බැවින් ඒවා අමතක කර ඩොලර් 15ක් පමණක් අතේ ඇතිව අගෝස්තු 5 වැනිදා ගමණ පිටත් වූයේ සම්පූර්ණ ආත්ම විශ්වාසයක් ඇතිවය. ප්‍රවේශපත්‍ර සනාථ කර (status-OK) නොමැති බැවින් ගුවන් යානයට ඇතුල්වීමේ අවසරපත (Boarding pass) නීත්‍යානුකූලව ලබාගත නොහැකිය. එබැවින් ගුවන් තොටුපලේ නිලධාරියෙකුට නයිරා 20 ක (40 US$) අල්ලසක් දී Boarding pass එක ලබා ගතිමි.

නයිජීරියාවේ අල්ලස් දීම සාමාන්‍ය දෙයකි. එසේ නොමැතිව කිසිම වැඩක් කරගත නොහැකිය. උදාහරණයක් ලෙස සාමාන්‍ය රාජකාරී ලිපියක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය භාර නිලධාරියාට භාරදෙන විට නයිරා 5 ක් පමණ ඔහුගේ ලාච්චුවට දැමිය යුතුය. එසේ නොකළහොත් එම වැඩය පසුවට කල් තබයි.

මීළඟ ප්‍රශ්ණය පැනනගින්නේ රෝමයේදී බැවින් ගුවන්යානය පිටත්වූ පසු, සම්‍යක්ප්‍රයෝගයක් කරමින් ඊට සූදානම් වූයෙමි. status-OK යනුවෙන් ටිකට්පතෙහි අලවන ස්ටිකරයක් මා ළඟ තිබුනි. කල් ඇතිවම නියමිත පරිදි අවශ්‍ය තොරතුරු(Flight number, ETD and status-OK) එහි සටහන් කරගෙන තිබූ අතර ප්‍රවේශ පත්‍රයේ නියමිත ස්ථානයේ අලවාගත් මම රෝම ගුවන් තොටුපොලේ ආසන වෙන්කරන නිලධාරිනියට ඉදිරිපත් කළෙමි. එම තොරතුරු පරිගනකයට ඇතුල් කර බලා ඇය කීවේ ආසන වෙන් නොකර බොරුවට එම ස්ටිකරය අලවා ඇති බවත්, නයිජීරියාවේ නිතරම මෙවැනි වැරදි කරන බවත්ය. පසුව පරිගනක තිරය මා දෙසට හරවා "මේ බලන්න ඔයාගෙ ටිකට් එක සනාථ කරල තියන්නෙ වෙන දවසකටයි." යනුවෙන් කියා නයිජීරියානුන්ටම දොස් පැවරීය. ඊට හය මාසයකට පමණ පෙර, ඉදිරි දිනයක් යොදා ආසන වෙන්කිරීමට ඉල්ලුම් කළ බව මට මතක් වූයේ එවිටය. කෙසේ හෝ පැය 24ක් ඇතුලත සුදුසු ගුවන් යානයක් අසුනක් ලබාදීමට උත්සාහ කරන බවට ඇය පොරොන්දු විය. ඒ අතරතුර, මා කලින් ආධුනික ගුවන්විදුලිය ඔස්සේ සන්නිවේදනය කරන ලද ඉතාලි ජාතික "බර්නඩිනෝ" (I0ODX) වෙත දුරකථන ඇමතුමක් දුනිමි. සුළු වේලාවකින් පැමිණි ඔහු මා හමුවිය. කෙසේ හෝ හැකි ඉක්මනින් ආසනයක් වෙන්කර දෙන බවට ඔහුද පොරොන්දු විය. (ඔහු travel agent කෙනෙක් බව එහිදී දැනගතිමි) මේ අතරතුර නයිජීරියාවේ වෙසෙන මිතුරෙක් වන අනිල් රත්නායක (ලංකවේ සිට නයිජීරියාවට යන අතරතුර) රෝම ගුවන් තොටුපොලේදී අහම්බෙන් හමුවිය. විස්තර කථාකළ පසු අවශ්‍ය වුනොත් වියදම් කිරීමට කියා ඩොලර් 35 ක් මට දුනි. ලංකාවට ආ විගස එය ආපසු දෙන බවට පොරොන්දු වුනත් අද වනතුරු ඔහු හමු නොවීය. පසුව ඉහත කී නිලධාරිනිය මා වෙත පැමිණ, දින කීපයක් යනතුරු කෙලින්ම කොළඹට යා නොහැකි බැවින් බැංකොක් හරහා යාමට කැමතිදැයි මගෙන් විමසීය. මා ඊට එකඟ වූයෙන් සියළු ප්‍රශ්ණ විසඳුනි. (ඒ සඳහා කිසිම අමතර මුදලක් අවශ්‍ය නොවූයේ නයිජීරියා එයාවේස් සමාගමේ වරදින් එය සිදුවූ බවට ඇයට ඒත්තු ගිය නිසාය) අධික ගමන් විඩාව නිසා ගුවන් යානය පිටත්වූ වහාම මා නින්දට වැටුනි. ආහාර ගැණීම සඳහා ගුවන් සේවිකාවක් විසින් මා අවදි කළ අතර ඉන් පසු නැවතත් නින්දට වැටුනි. කෙසේ වෙතත් පැය දහයක ගුවන් ගමණින් පැය නමයක්ම ගතකළේ නින්දේය.

මා ටැක්සියකින් ගෙදරට එනවිට කුසුම් පිස්සියක මෙන් වාහනය ඉදිරියට දුවගෙන එනු දුටු රියැදුරා මීදුලට ඒමට පෙර වහා රිය නතර කරන ලදී. පසුව මනෝවෛද්‍ය නාලක මෙන්ඩිස් මහතාගෙන් ප්‍රතිකාර ගැණීම නිසා තරමක සුවයක් ලැබූ බැවින් වෛද්‍ය උපදෙස් අනුව මාසයකට පමණ පසුව කුසුම් සහ තිලිනි දුව සමග නැවත නයිජීරියාවට යාමට අතින් මුදල් ගෙවා ගුවන් ප්‍රෙවිශ පත්‍ර ගෙන ගමණට සූදානම් වූයෙමු.

## පාස්පෝට් නැතිවීම

ගමණට සියල්ල සූදානම්කර නියමිත දිනට සතියකට පමණ පෙර දිනක් ගමන්බලපත්‍ර දෙකද රැගෙන අත් එන්නත් කිරීම සඳහා කොළඹ වරායට යාමට පිටත් වීමු. බස්රියේ අප හිටගෙන සිටි අතර කොස්ගස් හන්දියේදී කුසුම්ට අසුනක් ලැබින. මා අත තිබූ පාර්සලය (පාස්පෝට් දෙක සහ හැඳුනුම්පතද, 1982 දිනපොත සහ තවත් ලියකියවිලි) ඇය අතට දුනිමි. කොළඹ කොටුවේදී බසයෙන් බසින අතර, පාර්සලය අතේ නැතිබව දුටු මා ඒ ගැන විමසූවිට ඇය ගොළුවිය. තමා අත තිබූ පාර්සලයට කුමක් වීදැයි ඇය නොදනී.

පසුව ජාතික හැඳුනුම්පත සහ පාස්පෝට් අළුතෙන් ගෙන ගමනට සූදානම් වීමට මාස කීපයක් ගතවිය. 1983 ජනවාරි 9 වැනිදා චූටිදුව සහ කුසුම්ද සමග නයිජීරියාව බලා පිටත්වූයෙමු. (Colombo – Sofia – Kano – Bulgerian Air line)

## පොටි ගැලවීම

අවුරුද්දක් පමණ සතුටින් සාමයෙන් කාලය ගතවිය. සෑම සති අන්තයකම වාගේ විනෝද ගමන් සහ හිතමිතුරන් හමු වීමට සැතපුම් සිය ගනන් දුර යමින් කාලය ගතකලෙමු. දිනක් ගමණක් ගොස් තලතා මෆාරාහි නිවසට පැමිණි වහාම කාමරයට ගිය ඇය තම මුදල් පසුම්බිය විවෘතව ඇති බවත් මුදල් අඩු බවත් චෝදනා මුඛයෙන් පැවසුවාය. එය විය නොහැකි බව මා කීවත් කවුරුන් හෝ හොරෙක් ගෙතුලට පැමිණ ඇති බව ඈ තරයේම කියා සිටියාය.

ගේ ඇතුලට කිසිවෙකුට ඒමට හැකි තැනක් නොවීය. එසේ වුවද, පිටුපස යකඩ දොරේ එක් වීදුරුවක් කැඩී ඇති නිසා අඟල් 6x7 ප්‍රමාණයේ කපොලු තුනක් එහි විය. කුඩා ළමයෙකුට නම් එය තුලින් රිංගිය හැකිව තිබුනි. මා එදිනම වීදුරුවක් සහ පොටි ගෙනවුත්, පසුදා උදේම පිටපැත්තෙන් පොටි යොදා වීදුරුව සවි කළෙමි.

එදිනම අපි සොකෝටො ගොස් ආපසු පැමිණෙනවිට අඳුර වැටී තිබුනි. ලොකු ඉබ්බෙක් දමා ඇති ඉහතකී පිටුපස දොර විවෘත කර ගෙට ඇතුළු වීමු. ඉන් පැයකට පමණ පසු පෙරදින මා සවිකළ වීදුරුව හොරෙක් ගලවන්න උත්සාහ කරුඇති බව කුසුම් කීවාය. මා එය පරීක්ෂා කළවිට වීදුරුවෙහි තිබූ පොටි වලින් අඩක් පමණ ඉවත්කර ඇති බව දැක, ගෙදර තිබූ ඉතිරි පොටි ටික ගෙන නැවත පෙර පරිදිම වීදුරුව සවි කළෙමි. රාත්‍රි 10ට පමණ බිම වාඩිවී එය කරමින් සිටියදී මගේ පිටුපස බිම පොටි ගුලියක් ඇතිබව මම දුටුවෙමි. කුසුම් එය හැඳින්වූයේ හොල්මනක් කළ වැඩක් ලෙසිනි. ඇගේ මානසික රෝගී තත්වය නැවත මතුවීමේ පෙරනිමිත්තක් බව මට අවබෝධ විය. මුදල් සොරකමත් පොටි ගැලවීමත් මා විසින් කරනලද බවට පසු දිනක ඈ මට චෝදනා කළාය.

## මාව දොස්තර ළඟට ගෙන යාම

ඇගේ මාණසික තත්වය එන්න එන්නම බරපතල වන බැවින්, සුවාරිස් මහතා, හැරල්ඩ් මෙන්ඩිස් මහතා සහ අබේරත්න බන්ඩා මහතා සමග සාකච්ඡා කර, විශේෂඥ මානසික වෛද්‍යවරයෙක් වෙත ඇයව ගෙනයාමට තීරණය කළෙමි. තම උදරයේ ගෙඩියක් ඇති බවත්, විජේට මොලේ අමාරුවක් ඇති බවත් ඇය නිතර නිතර පැමිණිළි කරන බැවින්, ඒ සඳහා වෛද්‍යවරයෙක් ළඟට යාමට කැමති කරවා ගත්තේ සුවාරිස් මහතා විසිනි. කොතරම් කලබල කළත් ඔහුට පියෙකුට මෙන් ගෞරවපූර්වක සැලකිල්ලක් තිබුනෙන් සැමවිටම එම ගෞරවය නොකෙලසීමට මම විශේෂයෙන් වගබලාගතිමි.

සිංහල වෛද්‍යවරයෙක් ළඟට යායුතු බව ඇය තරයේම කියාසිටි බැවින් සැතපුම් 400 ක් දුර "කඩුනා" නගරයේ සිටින වෛද්‍ය පෙරේරා වෙත යාමට තීරණය කළෙමු. නමුත් මා පදවාගෙන යන වාහනයක් ඇය නොයන බව පැවසූ බැවින් මෝටර්රථ දෙකකින් ගමණ පිටත් වූයෙමු. (1984 මාර්තු 7) ඇය සුවාරිස් මහතාගේ රියෙහි ගිය අතර මගේ රියෙහි මෙන්ඩිස් මහතා පැමිණියේය. වෛද්‍යවරයා ඇය සමග සාකච්ඡා කළ අතර, ඇය නැති තැන සියළු විස්තර හෙළි කරන ලදී. ඉන්ජෙක්ෂන් එකක් සහ තවත් පෙති වර්ග දෙකක් (TRYPTIZOL – 25mg, ARTANE – 2mg පෙති එක බැගින් දිනකට දෙවරක්) නියම කළ අතර, මගේ මොලේ අමාරුවට බෙහෙත් දියයුතු බව ඈ කී බැවින්, මටද බෙහෙතක් ලියා දී, විටමින්-සී පෙති ටිකක් ගන්නා ලෙස ඇයට නොදැනෙනසේ කීවේය.

බොහෝ අවස්ථා වල ඇගේ බෙහෙත් පරෙස්සමට තබා තිබුනේ සුවාරිස් මහතා ළඟය. ඔහු බෙහෙත් රැගෙන අපේ ගෙදරට පැමිණ ඇයට දෙනු ලැබේ. සමහර අවස්ථා වල බෙහෙත් මා ළඟ තබාගත් අතර අපේ ගෙදරට පැමිණෙන ඔහු ඇයට නොදැනෙනසේ මගෙන් ඉල්ලා ගනු ලැබේ.

## කාලී යක්ෂාරූඪය

දිනක් (84 මාර්තු 9) තලතා මහාරාහි නිවසේදී තිලිනි නිදා සිටි අතර හදිසියේම මා අසලට පැමිණි කුසුම්,

"මම තමයි මහා භද්‍රකාලී යක්ෂණිය......"

යනුවෙන් පටන්ගෙන නොයෙක් දේ කියමින් මට තර්ජනය කරන්නට විය. ටික වේලාවක් ඊට සවන්දුන් මා,

"යකුන්ට මෙහෙ ඉන්න ඉඩදෙන්න බෑ"

"මගෙ කුසුම්ගෙ ශරීරයට යක්කුන්ට ආවේශ වෙන්න දෙන්නෙ නෑ"

කියමින් කම්මුල දෙපැත්තට පහර කීපයක් දුනිමි. එවිට ඇය

"අනේ විජේ ගහන්න එපා මම කාලී නෙමෙයි කුසුම්"

එවිට මම පහර දීම නවතා,

"කෝ කාලි යකා"

යයි විමසූ විට,

"කාලි යක්ෂණිය ගියා ආයි එන්නේ නෑ"

යයි කීවාය.

පසුව චූටිදූව අවදිවී සිටි අතර එම සිද්ධිය ඇය දකින්නට ඇත්දැයි සැකයක් මා තුල ඇතිවිය. ලංකාවට පැමිණ කලක් ගතවූ පසු ඇයට හොඳින් කථාකිරීමට පුළුවන් වූ අවදියේ දිනක් මා ළඟට පැමිණ, "තාත්ති ඇයි නයිජීරියාවෙදි අම්මට ගැහුවෙ" යයි විමසූවිට මගේ දෙනෙත් කඳුළින් තෙත් විය. "අම්ම නෝට් වුන නිසානෙ ගැහුවෙ" යනුවෙන් මා පිළිතුරු දුනිමි. එවිට ඇය "ආයිත් එහෙම ගහන්න එපා.....ආයි ගහන්නෙ නෑ නේද? " යනුවෙන් කීවාය. "නෑ චූටි පැටියො ආයි අම්මට ගහන්නේ නෑ"යනුවෙන් පොරොන්දු වූ අතර එය මෙතෙක් කඩ කළේ නැත.

## පත්තිනි නැටුම

දිනක් තලතා මහාරාහි නිවසේ සිටියදී මිදුලේ සින්දු කියමින් කුසුම් නටන්නට විය.

"පත්තිනි දෙයියෝ මට පවන් සලනවා....... "

යනුවෙන් සින්දු කියමින් නටනවිට චූටි දුවටද එය මහත් විනෝදයක් විය. වටපිට කොල්ලො කුරුට්ටො වටවී නැටුම් බලමින් විනෝදවන අතර, එහි සිටි ළමයෙකුගෙන් බීමට වතුර ටිකක් ඉල්ලූවිට, මම වතුර වීදුරුවක් ගෙනත් දුනිමි. එයට වස දමා ඇති බව කියා එය වීසි කර, ඉස්සරහ ගෙදර සිටි, තලතා මහාරා පොලිස් ස්ථානාධිපතිගේ දරුවෙකුට අඬගසා එම ගේ අසල ඇති බැරල් එකෙන් වතුර එකක් ගෙන්වාගෙන බිව්වාය. පසුව මට මුණගැසුන එම පොලිස් ස්ථානාධිපතිතුමා විස්තර අසා සිය කනගාටුව පළකර සිටියේය.

තවත් දිනක (1984 අප්‍රියෙල් 8) රාත්‍රි 8.30 ට පමණ ඇය ගෙදර නැති බව දැක, වටපිට සැමතැනකම සොයා බලා, නිදාසිටි චූටි දූවවද වඩාගෙන මෝටර් රථයෙන් සුවාරිස් මහතාගේ ගෙදරට (මී 300 ක් පමණ දුර) ගියවිට ඇය එහි සිටියාය.

## සූනියන් කැපීම

දිනක් (1984 මාර්තු 9) අප තිදෙනා (කුසුම්, තිලිනි සහ මම) බකුරා ගියේ සති අන්තය ගතකිරීමටය. (කි.මී. 50ක් පමණ දුර) බකුරාහි වෙසෙන සැම ලාංකිකයෙකුගේම (ගාමිණී සමරසිංහ, අයිවන් සහ චන්ද්‍රා සමරනායක) නිවෙස් වලට ගිය අතර, අයිවන්ගේ නිවසේ රාත්‍රී නවාතැන් ගතිමු. රාත්‍රි 8 පමණ වනතුරු සාමාන්‍ය ලෙස සතුටින් සිටි අතර හදිසියේම මිදුලේ තිබූ මල් පැලයක් වටකර බිම සිටුවා තිබූ යකඩ කූරු කීපයක් දුටු කුසුම් කලබල වී, එම යකඩ කූරුද මල් පැලයද ගලවා දමා එතැන පොළව හාරන්නට පටන්ගති. අප කවුරුත් එය බලා සිටි අතර එතැන හූනියමක් වලලා ඇති බවත්, ඊට නුදුරින් වෙසෙන දකුණු ඉන්දියානු ගුරු මහතෙක් පෙන්වා (නම මතක නැත) ඔහු මලයාලි ගුරුකම් කරන්නෙකු බවත් පවසා ඔහු සමග හවුල් වී මා විසින් ඇයව විනාශ කිරීම සඳහා මෙම හූනියම වලලා ඇති බවත් කීවාය. තවද එය ගොඩ දමා හූනියම කැපියයුතු බවද කීවාය.

එසේ හාරනවිට පොලිතින් උරයක් මතුවිය. "මේ තියන්නෙ හූනියම" යයි කෑගසමින් මිදුලේ උඩුබැලි අතට නිදාගෙන, එම පොලිතින් උරය පපුව මත තබාගෙන, දෙවියන්ට, මහාභද්‍රකාලී යක්ෂණියට, සූනියම් දේවතාවාට ආදීන්ට කන්නලව් කරන්නට විය. මෙම රාත්‍රියෙහි ශබ්ද නගා කෑගැසූ බැවින් අහල පහළ ගෙවල් 5-6 ක සිටි හැමෝම පිටතට පැමිණ එම නාඩගම නැරඹූහ. එම ජවනිකාව අවසන් වූයේ රාත්‍රි 11 ට පමණය. ඉන්පසු මැදියම් රැයේදී මිදුලේ සිටිමින්ම අසලවූ ටැන්කියෙන් වතුර ගෙන ස්නානය කළාය.

පසුව වැඩි කලබලයක් නැතිව නිදාගැන්මට සූදානම් විය. අප වෙනුවෙන් වෙන්කළ කාමරයට ගොස් එය පිරිසිදු කලයුතු බව පවසා, අතුගානවිට ඇඳයට තිබී අයිවන් මහත්මියගේ යටගවුමක් හමුවිය. එය අතට ගෙන හොඳින් පරීක්ෂා කර

"මේ තියන්නෙ මූං කොහෙද මාව රවට්ටන්නෙ"

යනුවෙන් කීවාය. එය දුටු අයිවන් මහත්මිය,

"ඕක මගෙ යටගවුමක්නෙ" යයි කී විට

"ඔයාගෙ වෙන්නෙ කොහොමද, අර ගෑණිට ළමය හම්බවෙනකොට ඇඳගෙන හිටියෙ මේක. ළමයව අල්ලපු රටේ මඩමක නතරතළාට යටගවුම හංගන්න බැරිවුනා. "

කියමින් තවත් නොයක් විකාර දොඩවමින් මුළු රාත්‍රියම කිසිවෙකුටත් නිදාගන්න ඉඩ නොදී, නොයෙකුත් විකාර කරන්නට විය.

## ගඟේ නාඩගම

බකුරා නාඩගමේ අවසාන ජවනිකාව රඟදැක්වූයේ පසුවදා උදේය. උදේ 7-8 පමණ වනවිට සොයාගත් භාන්ඩ (පොලිතින් බෑගය, යටගවුම සහ ටින්එකක්) ගඟට දැමියයුතු බව පවසා සැතපුම් කාලක් පමණ දුරින් පිහිටි බකුරා ගඟ ළඟට පයින්ම ගියාය. අප හැමෝම ඇය සමග ගියෙමු. ගඟ දෙපස වෙසෙන නයිජීරියානුවන් රැසක්ම බලා සිටියදී ඇය ගඟට බැස, ගඟ මැදටම ගියාය. ගඟේ එගොඩ දක්වාම වතුර ඇත්තේ පොවුවන තරමට පමණක් බව, අසල සිටි නයිජීරියානුවන්ගෙන් අසා දැනගතිමි. නමුත් ඔවුන් කීපදෙනෙක්ම ගඟට බැස ඇගේ ආරක්ෂාව සඳහා ගියහ. ගඟ මැදට ගිය ඇ දෙවියන්ට, යක්ෂ, ප්‍රේත භූතාදීන්ට කන්නලවු කරමින් ටින්එක පාකර හැර, පොලිතින් බෑගය සහ යටගවුම කෑලි කෑලි වලට ඉරා ගඟට දමා ආපසු ආවාය. ගඟේ නාඩගම පැය බාගයක් පමණ රඟ දැක්වූ අතර එය හැමෝටම විනෝදජනක අත්දැකීමක් විය.

## මලයාලි කම්බි ගුරුකම්

සමහර දවස් වල ඇය, ගේ හැමතැනම සහ මිදුලේ ඇවිදිමින් කම්බි සහ වයර් කැලි එකතු කරමින් මට දොස් පවරන්නට විය. දිනක් සුවාරිස් මහතා පැමිණිවිට එම කම්බි කැලි පෙන්වා බකුරාහි පදිංචි දකුණු ඉන්දීය ගුරුමහතාගේ නම කියා "මිනිහ විජේ එක්ක එකතු වෙලා මලයාලි කම්බි ගුරුකම් කරනව" යයි කීවාය. එවැනි වචනයක් මා මින්පෙර කිසිදාක අසා නැත. සුවාරිස් මහතාටද එය අළුත් වචනයක් විය. මගේ කාමරය ඇගෙන් ආරක්ෂා කරගත්තේ ඉතාමත් අමාරුවෙනි. එය සැම විටකම දොරගුළු දා තැබීමට සිදුවිය.

දිනක් අපි මැරඩුම් ගොස් ප්‍රේමතිලකගේ නිවසෙහි රාත්‍රිය ගතකළෙමු. පසුවදා බකලෝරි ජලාශය නැරඹීමට ගියෙමු. එහි බැම්ම දිගේ යනවිට යමක් ජලාශයට වීසිකළ බව මම දුටුවෙමි. වීසි කළේ කුමක්දැයි විපරම් කර බැලූවිට දැනගන්නට ලැබුනේ මොනවාදෝ ඇළුමිනියම් කම්බි ගුලියක් ඇ ළඟ තිබූ බවත් එය ජලාශයට වීසිකරන්නට ඇති බවත්ය.

ගෙදරට පැමිණි වහාම මම කාමරයට ගොස් ගලවා තිබූ ඇන්ටෙනාව(HI-GAIN – TH3JR) පරීක්ෂා කළෙමි. මිමී 4 ඇළුමිනියම් කම්බියක් විශේෂ ආකාරයකට නමා සාදා තිබූ β-matching stub එක වැඩි පරෙස්සමට බිත්තියේ ඇනයක එල්ලා තිබිනි. නමුත් එය එහි නොතිබූ බැවින් සිදුවී ඇති දේ සැනෙකින් මට අවබෝධ විය. ලංකාවට පැමිණි පසුව අමෙරිකාවේ HI-GAIN සමාගමට ලිපියක් යවා එහි සැලැස්ම (Blue print) ගෙන්වාගෙන ඇලුමිනියම් කම්බියකින් එය සාදා ගතිමි.

## පෝලන්ත වෛද්‍යවරිය හමුවීම

ඇගේ රෝගය උත්සන්න වන බැවින් සොකෝටෝ මහරෝහලේ මනෝවෛද්‍යවරිය වන Dr. Mrs. Maria හමු වූයෙමි. ( 1984 මාර්තු 13) පළමුව මා තනිව ගොස් ඇ හමුවී කරුණු සියල්ල පවසා පසුව කුසුම්ව රැගෙන යන ආකාරය, අමිතා සහ සුගතපාල සමගත් තවත් අය සමගත් සාකච්ඡා කළෙමි. ඒ අනුව කලින් සැලසුම් කළ ආකාරයටම සියල්ල සිදුවිය.

එම සැලසුම මෙසේය:-

මා කුසුම් සමග මගේ මෝටර් රථයෙන් යනවිට RMV office එක අසල හන්දියේ, පාරට නොපෙනෙන අයුරු නවතා ඇති තම මෝටර් රථයෙන් අමිතා සහ සුගත් අප පිටුපසින් පැමිණ ඉස්සරවී, හදිසියේ හමුවූ අයුරු නතර කරන ලදී. එය දුටු කුසුම් "අන්න අමිත ඉන්නව පොඞ්ඩක් නවත්වන්න" කී විට මම පිටුපසින් නතර කළෙමි. පසුව අමිතා සැපදුක් කථාකරමින් බඩේ ගෙඩිය පිළිබඳව විමසා හොඳ වෛද්‍යවරියක් සිටින බව පවසා, අමිතාද දැන් ඇය හමුවීමට යන බව කී විට කුසුම්ද ඔවුන්ගේ රියට ගොඩවිය.

පසුව කෙලින්ම රෝහලට ගොස් වෛද්‍යවරිය වෙත ගියෙමු. කාමරය අසල තිබූ PHYCHIATRIC CLINIC යන නාමපුවරුව අඩක් වැසෙන්සේ මම සිටගතිමි. කුසුම් සමග විස්තර කතාකර බෙහෙත් නියමකළ එතුමිය, පසුව හමුවන ලෙස මට සෙමින් කීවාය. ඉන්පසු කුසුම්, අමිතා සහ සුගත් සමග නික්ම ගිය පසුව මම නැවත ගොස් වෛද්‍යවරිය හමු වූයෙමි. එවිට ඇය කීවේ විදේශයක සිට ප්‍රතිකාර කිරීම ඉතා අපහසු බවය. හැකි ඉක්මනින් ලංකාවට යාම නුවණට හුරු බව ඇය යෝජනා කලාය. ඇගේ උපදෙස් පරිදි ගුවන් ප්‍රවේශ පත්‍ර ඉක්මනින් ලබාගැනීම සඳහා රෝහලින් ලිපියක්ද ලබා ගතිමි. පසුව අතින් මුදල් ගෙවා ටිකට් තුනක් ගෙන 1984 අප්‍රියෙල් 17 වැනිදා පිටත්ව 19වැනිදා ලංකාවට ආවෙමු. (රජයෙන් ගුවන් ටිකට්පත් ලබාගතහැකි වුනත් ඒ සඳහා සති ගණනක් ගතවේ.)

## මෝටර් රථය දන්දීම

හදිසියේ ආපසු පැමිණි බැවින් මගේ මෝටර් රථය (VW-1500 registration No. SO 5014 SB) විකුණාගැනීමට අවස්ථාවක් නොලැබිනි. එය විකුණා මුදල් එවනලෙස දන්වා මිතුරෙකුට (රංජිත්) භාරදී ආවෙමි. එය බංග්ලාදේශ ජාතිකයෙකුට විකුණා (US$ 1100) බැන්ක් ඩ්‍රාෆ්ට් එකක් ගෙන, එය වෙනත් මිතුරෙක් අත එවා තිබුනි. ඔහුගේ බඩු සියල්ල ගුවන් ගමනේදී නැතිවූ බැවින් රංජිත්ට ඒ බව ලිපියකින්

දන්වා ඇත. ඒ අතරතුර රංජිත් ලංකාවට පැමිණ ඇති බැවින් මේ කිසිවක් දැනගන්නට ලැබී නැත. මෙම කාල සීමාව තුල මා සිටියේ දැඩි මානසික පීඩනයකින් බැවින් ඒ පිළිබඳව අවධානයක් යොමුකළ නොහැකි විය. විස්තර සියල්ල හෙළි වූයේ අවුරුද්දක් පමණ ගතවූ පසුවය. පසුව එම bank draft එක නිකුත් කරන ලද ලන්ඩන්හි බාර්ක්ලේස් බැංකුවෙන් විමසීම් කළත් එය නිශ්ඵල විය.

## බරපතල අග-හිඟ කම්

නයිජීරියාවේ සිට ආපසු පැමිණි පසු මා අතේ එදිනෙදා වියදම් සඳහා තිබුනේ ඉතා සුළු මුදලක් පමණි. කුසුම්ගේ අභූත චෝදනා, නිනදා, අපහාස හේතුකොටගෙන ඇගෙන් ශත පහක්වත් නොඉල්ලන ප්‍රත්පත්තිය අද දක්වාම රකිමි. මීට වසර 15-20 කට පෙර ආරම්භ කරනලද මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිනුම පරීක්ෂා කළවිට රු300 ක් පමණ ඇති බව දැක ඉන් රු100ක් ආපසු ගත්විට දුටුවේ එහි නව ශේෂය රු3000ක් පමණ බවය. කලක් ගතවනතුරු වියදම් කළේ එම මුදල්ය.

## මංගල මුද්ද විකිණීම

නොගැලපෙන විවාහයේ කටුක අත්දැකීම් හේතුකොටගෙන මංගල මුද්ද ඇඟිල්ලෙන් ඉවත් කළේ කලකට පෙරය. එය, මා සැලකුවේ ආදර සිහිවටනයක් ලෙස නොව අමිහිරි සිහිවටනයක් ලෙසය. එබැවින් එය විකුනා නිවාස දෙපාර්තමේන්තුවෙන් ගත් ණයමුදලෙහි ඉතිරි කොටස ගෙවාදැමුවෙමි.

## පුරුදු රැකියාව නැවත ලබාගැණීම

ලංකාවට පැමිණ මාස කීපයකට පසු නැවත ඉල්ලුම් කිරීමෙන් පසු ගුවන් ගමන් පාලක තනතුරේ වැඩ භාරගැණීමට නියමිතව තිබුනේ 1984 අගෝස්තු පළමුවැනිදාය. ඊට පෙර දින රාත්‍රියේ මා ළඟ ගෙදර නැති සුවඳක් ඇති බව පවසමින් නොයෙක් විකාර කියමින් මුළු රැම නිදාගැනීමට ඉඩ නුදුනි. අළුයම පහට පමණ ඇයට නින්ද ගිය බැවින්, රැකියාවේ වැඩ භාරගැණීමට ගියේ පැයක පමණ නින්දකින් පසුවය.

## කුසුම් ගෙදරින් පිටවීම

සති කීපයකට පසු 1984 අගෝස්තු 25 වැනිදා නැවත ආපසු නොඑන බව කියා ඇය නිවසින් පිටව ගියාය. එසේ යන අතරමග ජයරත්නගෙ කඩේ, උපනන්දගෙ කඩේ සහ තවත් කීප තැනකම නතරවී හමුවන අය සමග මට ඉතා තදබල ලෙස අපහාස කරමින් ඉතාමත් නින්දිත අයුරින් දොස් පවරා ඇත. දින කීපයකට පසුව මට හමුවූ උපනන්දගේ මව මට කීවේ "අනේ මල්ලියෙ කුසුම් කියපු කතාවල් කට ඇරල කියනව තියා මනුස්සයෙකුට අහගෙන ඉන්නවත් බැරි දේවල්"යනුවෙනි.

දින කීපයක්ම, සුදු අක්කලගෙ ගෙදර, වසන්ත එදිරිසිංහගේ ගෙදර, වෛද්‍ය ජයන්ත නානයක්කාගේ ගෙදර ආදී තැන්වල ගතකර, හිඹුටානේ විසූ, කුසුම්ගේ ළඟම ඥාතියෙක් වන විජේසිරිගේ ගෙදර දානයකට සහභාගි වීම සඳහා පැමිණ සිටියාය. මමද එදා චූටිදුව සමග එහි ගොස් සිටියදී, චූටිදුවව වඩාගත් ඇය මාහේන ගෙදරට ගියාය. මාහේන සිට පැමිණි තවත් ඥාතීන් කීපදෙනෙක්ම ඇය සමග ගිය බැවින්, තිලිනිව රැගෙන යාම ගැන මම විරුද්ධත්වයක් නොදැක්වීමි. මාහේන සිට ඇය දිනපතාම රැකියාවට පැමිණි අතර, මම දිනපතාම වාගේ ඇගේ යෙහෙලියක් වන වසන්ත එදිරිසිංහට කථාකර තොරතුරු ලබාගතිමි. නමුත් කිසිවිටකත් කුසුම්ට කථා නොකළෙමි.

## ආපසු පැමිණීම - පළමුවරට සමාව ගැණීම

දිනක් ඇය මට දුරකථනයෙන් කතාකර "විජේ මම ගෙදර එන්නද" යයි විමසීය. මගේ පිළිතුර වූයේ "මං ඔයාට යන්න කීවෙත් නෑ, ඔයා මගෙන් ඇහුවෙත් නෑ, ඒ නිසා මං ඔයාට එන්න කියන්නෙත් නෑ, එපා කියන්නෙත් නෑ" යනුයි. ගෙදරින් ගොස් මාස එකහමාරකට පමණ පසු 1984 ඔක්තෝබර් 15 වැනිදා ඇගේ පියාද සමග චූටිදුවත් කැටිව ගෙදරට පැමිණියාය. එසේ පැමිණ තම පියා

ඉදිරිපිටදී **මින්පසු කවදාවත් මාව අවිශ්වාස නොකරන බවත්, මුන්නේශ්වරම් ගොස් ඒබව දිවුරා කියන බවත් කීවාය.** නමුත් මා එවිට කීවේ කොයි ආකාරයෙන් කීවත්, මං ඔයාගෙ වචන විශ්වාස නොකරන බවත්, අවුරුදු ගණනක් ගතවූ පසු ඒ බව ක්‍රියාවෙන් පමණක් තේරුම් ගන්නා බවත්ය.

ලොකුදුව පොඩි අක්කාගේ ගෙදර සිටින බැවින් බොහෝ දිනවල පුතාද එහි යාමට පුරුදුව සිටියේය. චූටි දුව පැමිණි පසු ඇයද එහි යාමට පටන් ගැණීම තවත් ප්‍රශ්ණයක ආරම්භයක් වේදැයි මට සැකයක් පහළවිය. පළමුව සති අන්ත පමණක් එහි ගතකිරීමට ඉඩදී පසුව ක්‍රමයෙන් උපායශීලීව දෙදෙනාම ගෙදරට ළං කරගතිමි.

අවුරුද්දක් පමණ සාමකාමී වාතාවරනයක් පැවතුන අතර පසුව නැවතත් නොයෙක් විකාර වැඩ කරන්නට විය. වරෙක (86 පෙබරවාරි 14) මගේ කාමරයේ දොර ළඟ තෙල් වර්ගයක් හලා තිබුනි. තව දවසක් මගේ කාමරයේ දොරේ හැන්ඩ්ල් එකේ සහ ඇන්ටෙනා කනුවේ මා නිතර අල්ලන තැන්වල ඌරු තෙල් තවරා තිබුනි. කීප වරක්ම ජල කරාම විවෘතකර තිබීම නිසා වතුර ටැන්කිය හිස් විය.

## <u>පොලීසියෙන් පැමිණීම</u>

1986 මාර්තු තුන්වැනිදා දවල් මා මගේ කාමරය තුල යම් වැඩක් කරමින් සිටියදී වාහනයක් මිදුලට එන හඬක් ඇසී ජනේලයෙන් බැලූවිට, පොලිස් ජීප් රථයක් නතරකර ඇති බවත් තුවක්කු රැගත් පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ඉන් බැස දුවන බවත් දුටුවෙමි. එක්කෙනෙක් ගේ පිටුපසට දුවන බව පෙනුනි. සිදුවන්නේ කුමක්දැයි එකවරම සිතා ගැණීම දුශ්කර විය. නමුත් මා සිතුවේ යම් හොරෙක් අල්ලන්නට දුවන බවය. මා පිටතට යාම සඳහා හැරුනවිටම දුටුවේ දොර ළඟ ඉතා රෞද්‍ර ලෙස මා දෙස බලා සිටින පොලිස් නිලධාරියෙකි. (ඔහු අංගොඩ පොලිසියේ ස්ථානාධිපති මහතායි) ඔහු එක්වරම කථාකර,

“මේ ගැණුන්ට ගහන වීරය නේද? ” යයි පැවසීය.

එවිට මා පිළිතුරු දෙමින්, “නෑ එහෙම දෙයක් නෑ මගෙ වයිෆ්ගෙ මොලේ අමාරුවක් තියනව, මේ දවස්වල බෙහෙත් ගන්නෙ නෑ ඒකයි ප්‍රශ්ණෙ” යයි කීවෙමි.

එවිට “මොලේ අමාරුව කාටද කියල බලා ගත්තහැකි පොලිසියට ගිහිල්ල”යයි කීවේය.

එවිටම මේසය මත ඇති ට්‍රාන්සීවරය පෙන්වා “මේ මොකද්ද? ” යයි ඇසීය.

“මේ Amateur Radio Transciver එකක්” යයි කී විට,

“අපි දන්නෙත් නැහැනෙ ඔහොම එකක් තියෙන බව කෝ ඕකෙ ලයිසන් එක” යයි පැවසූ විටම, බලපත්‍රය සහිත ලිපි ගොනුව ඔහු අතට දුනිමි. ඒ සමගම මේසය මත තිබූ ගුවන් ගමන් පාලක හැඳුනුම්පත දැක අතට ගෙන පරීක්ෂා කරන ගමන්ම ට්‍රාන්සීවරය පෙන්වා “ඕක දානව බලන්න” යයි කීවේය. මම එහි සුවිචය ඔන් කළ නමුත් ක්‍රියා නොකළ නිසා “ලයිට් ගිහින් ඇති”යයි කියමින් දොර දෙසින් එබී බැලූවිට ප්‍රධාන සුවිච් පුවරුවේ මා සවිකර ඇති නියොන් බල්බය දැල්වෙන බව දැක,

“නෑ ලයිට් තියනව ට්‍රිප් ස්විච් එක ඕෆ් වෙලා” යයි මම කීවෙමි. ඔහු පැමිණෙන ගමන්, ඔහු විසින්ම ට්‍රිප්එක ඕෆ් කර ඇති බව මට සැනෙකින් අවබෝධ විය.

එවිට ඔහු “ට්‍රිප් ස්විච් එක ඔෆ් වුනහම ඕක වැඩ කරන්නෙ නැද්ද? ” යයි විමසීය.

“නෑ මේක මේන් කරන්ට් වලින් වැඩ කරන්නෙ” යයි කී විට නැවතත් ඔහු

“එතකොට මේ කාමරේට Supply එක නැද්ද, ට්‍රිප් එක OFF වුනහම” යයි විමසීය.

“නෑ ට්‍රිප් ස්විච් එක හරි මේන් ස්විච් එක හරි ඔෆ් වුනහම ගෙදර කොහාටවත් කරන්ට් නෑ”

මේ වනවිට ඔහුගේ මුහුනේ තබූ රෞද්‍ර ගතිය පහව ගොසිනි. පසුව කුස්සියට ගොස් පොරනුව තුලට එබී එහි ලයිට්එක අසල එල්ලෙමින් තිබූ තඹ කම්බිය පෙන්වා “මේ මොකද්ද? ”

“ඔය earth wire එක, මේ ප්ලග් එක පිච්චිලා තිබිල ගැලෙව්ව. තාම හොඳ earth wire එකක් සවි කරන්න බැරි වුනා ”

“එතකොට ඕකෙන් shock වදින්නෙ නැද්ද? ” “නෑ මේ බලන්න” කියමින් මම එය අතින් ඇල්ලුවෙමි. (මේ වනවිට ට්‍රිප් ස්විචය ඔන් කර තිබුනි.)

එවිට මුහුනේ සැර බාල වන බව හොඳින් පෙනෙන්නට විය.

එවිට මට මෙසේ සිතුනි.

“මෙයා දැන් හිතනව ඇති, ගෑණියෙකුට කවදාවත් මෙහෙම රවට්ල්ලක් නම් වෙලා නෑ කියල”පසුව ගෙයි මැද සාලයට පැමිණ උඩ බලා බිත්තිය උඩින් ඇද ඇති තඹ කම්බිය පෙන්වා (මේ කාලයේ සිවිලිම් ගසා නොතිබිනි) “අර මොකද්ද ඕකට supply එක දාල නේද තියන්නෙ. ”
“නෑ ඒ නිකම් කම්බියක්, (කුසුම්ව පෙන්වමින්) මං මෙයාට කියල තියන්නෙ කරන්ට් කම්බියක් උඩ ඇදල තියනව කියලයි”
“මෙයා එක එක්කෙනාව උඩට නග්ගවල මගෙ කාමරේ ඇරගෙන නොයෙක් විකාර වැඩ කරනව”
“ඒ නිසා මං බොරුවට එහෙම කියල තියන්නෙ”
එනවිට පොළවට අඟල් ගානක් උඩින් ආවත් දැන්නම් බිමටම බැස ඇතිබව පෙනෙන්නට විය. දිග සුසමක් හෙලා වාඩිවී “Mr. විජේරත්න වාඩි වෙන්න. Mrs.විජේරත්නත් වාඩිවෙන්න.” යයි කීවේය. එතෙක් කිසිම ගරුසරුවක් නැතිව කතා කළ බැවින් මමද ඔහුට කිසිම ලෙසකින් ආමන්ත්‍රනය නොකර අහන ප්‍රශ්ණයට පමණක් පිළිතුරු දුනිමි. පසුව ඔහු කුසුම්ට අවවාද කර,
“බෙහෙත් ගන්න Mr.විජේරත්න එක්ක යන්න බැරි නම් තාත්තත් එක්ක යන්න” යයි පැවසීය.
පසුව ඔහු වාහනය දෙසට යන ගමන් ආපසු හැරී කුසුම්ට නොපෙනෙන ලෙස මට ඉඟියක් කර අඬගිසීය. මා ළඟට ගියවිට, “Mr. විජේරත්න කොයි වෙලාවක හරි පොලිසියට ඇවිල්ල කටඋත්තරයක් දෙන්න, ලොකු පැමිණිල්ලක්නෙ දාල තියන්නෙ. ” යයි පැවසීය.
ඒ අනුව සැන්දෑවේ පොලිසියට ගිය මම පිටු ගණනාවකින් යුතු ඇගේ පැමිණිල්ල කියවා බැලුවෙමි. එහි අනු අංකය CIB 208/19 – 3.3.1986 වූ අතර එහි අඩංගු කරුණු වල සාරාංශය මෙසේය.

1. මා ඇයට වස දී ඇති බව
2. මා ඇගේ ජීවිතය නැති කිරීම සඳහා විදුලි කම්බි යොදා ඇති බව
3. මා වංචාසහගත ලෙස විදුලිය පාවිච්චි කරන බව
4. මා අනාචාරයේ හැසිරෙන බව
5. මගෙන් දික්කසාද වීමට ඇයට අවශ්‍ය බව

එය හොඳින් කියවා බැලූ මම එහි සඳහන් චෝදනා සියල්ලම සම්පූර්ණයෙන්ම අසත්‍ය බවත්, ඇයට ප්‍රතිකාර කර සුවකරනු විනා ඇගෙන් දික්කසාද වීමට මගේ කිසිම අදහසක් නැති බවත් සඳහන්කර පේලි දෙකතුනකින් යුතු ඉතා කෙටි ප්‍රකාශයකට අත්සන් තැබුවෙමි.

එහි අනු අංකය:- CIB 218/26 – 3.3.1986

## සාම සාකච්ඡා - 2වැනි වරට සමාව ගැණීම

කුසුම්ගේ ඉල්ලීම පරිදි ඇගේ පියා සහ පුංචිඅම්මා පැමිණ (1987 ජනවාරි 1වැනිදා) ආපසු සමාදාන වීම සඳහා සාකච්ඡා කරන ලදී. <u>තමා කළ සියළු වැරදි පිළිගන්නා බව පවසා ඔවුන් ඉදිරියේ මට වැඳ සමාව ඉල්ලුවාය.</u> නමුත් දැන්ම එය පිළි නොගන්නා බව පැවසූ මම තමා කළ වැරදි පිළිගන්නා බව සත්‍යයක් යයි මට අවබෝධ වෙනතුරු ඇය මගේ බිරිඳ ලෙස පිළි නොගන්නා පව පැවසුවෙමි.

පසුගිය හත්අවුරුදු කාලය තුල මෙසේ සමාව අයැදින්නේ හතරවෙනි වතාවටය. මේ වනවිට රෝගී තත්වයක් පෙනෙන්නට නොතිබූ අතර, ඇගේ හිතුවක්කාර මුරන්ඩු ගති ඉස්මතුවී පෙනුනි. කෙසේ වෙතත් පිටස්තර අයට ඇගේ රෝගී තත්වයක් දක්නට ලැබුනේ ඉතා සැලකිල්ලෙන් නිරීක්ෂණය කළේනම් පමණි.

## සුමිත්‍රයෝ

පසු දිනක (1990 මැයි7) කොළඹ හෝර්ටන් පෙදෙසෙහි “සුමිත්‍රයෝ” වෙත ගොස් ඒ පිළබඳව විස්තරාත්මකව සාකච්ඡා කළෙමි. ඔවුන් නොයෙක් උපදෙස් දුන් අතර කෙසේ හෝ ඇයව මුණගැස්විය හැකි නම් මෙම ප්‍රශ්ණය විසඳිය හැකි බවට විශ්වාසය පළකලහ. ඇගේ යහළු යෙහෙලියන් හරහා මෙම පණිවිඩය ඇ වෙත යොමු කලත් ඊට පැහැදිලි ප්‍රතිචාරයක් නොලැබින.

පසුව මා හා රැකියාවේ නියුතු මාගේ සුමිත්‍රයින් වන චරිත, උපාලි, රොහාන්, සුසන්ත සහ අජිත් යන අයගෙන් ලැබූ සහයෝගය සහ උපදෙස් ඉතා අගනේය. සමස්ථයක් ලෙස ගත්කළ ඔවුන්ගේ අදහස

වූයේ, මගේත් දරුවන්ගේත් ආදර සැලකිලි නොඅඩුව ඇයට හිමිවියයුතු බවය. වුවිදු තිළිනි තවම ලාබාල බැවින් ඇයට මෙම ප්‍රශ්ණය ගැන වැඩි යමක් නොකීවෙමි. නමුත් චතුරිකා-දුව සහ ගෞරික-පුතා ළඟට ගෙන තම මවගේ අසණීප තත්වය තේරුම් කරදී, ඇගේ හිත නොරිදවා, ආදරයෙන් සලකන ලෙස අවවාද කළෙමි. එය ඔවුන් මනාලෙස ඉටුකරන බව පැහැදිලිව පෙනෙන්නට තිබූ අතර මමද හැකි තරම් ආදරය පෙන්වමින් හැකි සෑමවිටම ඇගේ සිතැඟි ඉටු කිරීමට වග බලා ගතිමි. වසර දෙකකට වරක් පැනනැගුන අසහනකාරී තත්වය පසුගිය වසර තුනහමාර තුල (1990 සිට 93 තෙක්) දක්නට නොලැබීම මා ලද විශාල ජයග්‍රහනයකි. මානසික සහනයකි. අපගේ යුගදිවි යාත්‍රාව නිසල සයුරකට පිවිස ඇතිබව මා සඳහන් කළේ මේ හේතුවෙනි. චන්ඩ මාරුත ගල්පර යලි හමු නොවේවා යනු මාගේ එකම බලාපොරොත්තුව හා පැතුමයි. විසිපස් වසරකට පෙර අප අතර පැවති පිරිසිදු ආදරයට අද හිමිව ඇත්තේ සියල්ලටම හිමි අනිත්‍ය ස්වභාවය නොවේද?

ගෙවුන අතීතයේ කෙදිනක හෝ ඔබ සිතන ආකාරයේ වරදක් මා අතින් සිදු නොවුනත් පෙර සංසාරයේ කිසියම් භවයක එවැන්නක් සිදුවන්නට ඇත. ගතවූ විසිහත් වසර තුලම එම පවු පලදුන්නත් අවසානයක් පෙනෙනතෙක්මානයේ නැත.

මිත්‍යා දෘශ්ටියෙන් වෙලී ඇති ඔබට අවසන් මොහොතේ හෝ සත්‍ය අවබෝධ වේවා යනු මගේ එකම පැතුමයි. එය ඉටු නොවේ නම් මතු සංසාරයේ කෙදිනකවත් මට ඔබව යලි හමු නොවේවා යනු මගේ අවසන් පැතුම වේ!

1997 අප්‍රියෙල් 22

## බණ්ඩාරවෙල ගමණ

1996-98 කාලයේ දිනක් කුසුම්ගේ රාජකාරි ගමණක් සඳහා බණ්ඩාරවෙල යාමට සිදුවිය. දෙවන පන්තියේ දුම්රිය ප්‍රවේශ පත්‍ර ලැබී තිබුනද අප තුන්වැනි පන්තියේ මැදිරියට ගොඩවී වාඩි වූයෙමු. පසුව ඇය එහි සිටියදී මා බැසගොස් දෙවන පන්තියේ මැදිරි දෙස විමසිලිමත් වූවිට ඉඩකඩ ඇතිබව දැක ආපසු පැමිණ ඒ බව පවසා එහි යාමට අඬගැසුවෙමි. එවිට එහි සිටින හැමෝටම ඇසෙන ලෙස <u>"ඔයා ඔය මාව එක්ක යන්නයි කියන්නෙ මට බැහැ"</u> යනුවෙන් කීවාය. මා මොහොතක් කල්පනා කර ආපසු ගෙදර යාමට අදහස් කළත් දෙවරක් සිතා බලා ඇය ගැන අනුකම්පා කර ඇ අසලින් වාඩි වූයෙමි.

## ටැක්සි රියැදුරන් ඉදිරිපිටදී අපහාස කිරීම

දිනක් ඇය සමග අංගොඩ වෙළඳපොලට ගොස් දෙල්ගහවත්ත පාරේ පරන තැපැල්හල අසල ත්‍රිරෝද රථගාලේ කාර්එක නවතාගෙන මා සිටියදී ඇය බඩු ගැණීමට ගියාය. ටික වේලාවකට පසු ආපසු පැමිණ පාරෙ එහා පැත්තේ සිටිමින් ඉතා රෞද්‍ර ස්වරයෙන් කෑගසමින් "<u>තමුසෙ ඕතන මහත්තය වගේ ඉඳගෙන ඉන්නව අර බඩුටික ගෙනියන්නෙ නැද්ද</u>" යනුවෙන් පළාතටම ඇසෙන ලෙස කීවාය. අවට ත්‍රිරෝද රථ රියදුරන් සියල්ලෝම ඒ දෙස බලා සිටියහ. මා වචනයක්වත් කථා නොකර මෝටර් රථය හරවා ගත්තේ ආපසු ගෙදර ඒමටයි. නමුත් මී 100ක් පමණ ගියපසු ඇ ගැන අනුකම්පා සිතී හන්දියේ ඇති අනෙක් රථගාලේ නතර කරගෙන රිය තුලට වී සිටියෙමි. ගත් බඩු සියල්ල තනිවම උස්සාගෙන පෙරමෙන් හතරගුණයක පමණ දුරක් පයින් ඒමට ඇයට සිදුවිය. ( මේ වනවිට මානසික රෝගී තත්වයක් පෙනෙන්නට නොතිබුනි. මුළුමනින්ම ඇත්තේ ගුණමකු ගතිය සහ අසත්පුරුශ කම බවයි මගේ හැඟීම)

ටැකසි රියැදුරන් ඔවුන්ගේ මිතුරන් සමග එම සිද්ධිය මෙසේ විස්තර කරන්න ඇතැයි මට සිතුනි. <u>"මචං නෝන කෙනෙක් ඩ්‍රයිවරයට සත්තමක් දැම්ම ඌ රස්සාවත් එපා කියල නෝනවත් දාල ගෙදර ගියා."</u>

## ඒඩ්ස් සැකය

දැනට වසරක පමණ කාලයක සිට පැනනැගී ඇති අළුත්ම සැකය නම් මට ඒඩ්ස් වැළඳී ඇති බවයි. 2003 අගදී පමණ දිනක් මාගේ හිතමිතුරු වෛද්‍යා ජයන්ත නානයක්කාර මහතා දුරකථනයෙන් කථාකර කුසුම්ගේ පණිවිඩයක් තිබෙන බව කීවේය. මම සිනාසී ඒ මොකද්ද, මා එක්ක කෙලින්ම කියන්න බැරි එකක්දැයි කීවිට, ඔහු කීවේ මට ඒඩ්ස් වැළඳී ඇති බවත්, ඒ ගැන පරීක්ෂා කර එහි වාර්තාව ඇයට ඉදිරිපත් කළයුතු බවත් කුසුම් කී බවය. එහෙම දෙයක් අවශ්‍යා නම් ඒ සඳහා උසාවි නියෝගයක් අරන් එන්න කියල එයාට කියන්න. යනුවෙන් මම කීවෙමි. මට ඒඩ්ස් හැදෙන්න තියෙන එකම මග ඇයගෙන් පමණක් බවත් මම කීවෙමි. අඩු වශයෙන් ඉන්ජෙක්ෂන් කටුවක්වත් මෑත කාලයේ භාවිත කර නොමැති බව මම කීවෙමි. මෙම බරපතල චෝදනාවෙන් පසු ඇගෙන් සදහටම වෙන්වී සිටීමට මම තීරණය කළෙමි.

මාස ගණනක් නිශ්ශබ්දව සිට දිනක් (2003 දෙසැ-3) තිලිනි සහ ශෞරික ඉදිරියේ ඉතා අශීලාචාර අමූලික බොරු චෝදනා රැසක් එල්ල කළාය. ඒ කිසිවක අබමල් රේනුවක තරම්වත් සත්‍යයක් නොමැති වූවත් දරුවන් ඉදිරියේ එතරම් අශීලාචාර ලෙස චරිත ඝාතනය කිරීම මට විශාල මානසික වදයක් විය.

දස වසරකට වැඩි කාලයක් කල්දමමින් සිටි තීරණය, එනම් ඇගෙන් සදහටම වෙන්වන අවසන් තීරණය වැඩිකල් නොයවා ක්‍රියාවට නැංවීමට තිරලෙස අදිටන් කරගතිමි. දැඩි මානසික පීඩනයක් යටතේ ගතකළ පසුගිය තිස්වසරකට වැඩි කාලය දරුවන් වෙනුවෙන් මුළුමනින්ම කැප කළ අතර තවදුරටත් එසේ කිරීම අනවශ්‍යා බව මගේ අදහසයි.

## ගෙදර හැර යාම

වසර 2010 දී ඇගේ කෙනෙහිලි උග්‍ර බැවින් නැවත නොඑන ලෙස ගෙදරින් පිටවීමට කීරණය කළෙමි. (මෙය වසර දහයක පමණ සිට පැවති ක්‍රියාත්මක නොවූ තීරණයකි) අත්‍යවශ්‍යා දේවල් සියල්ල රාත්‍රියේදී මෝටර් රථයට පටවාගෙන, චූටි දුවට ලිපියක් ලියා තබා 2010 පෙබරවාරි 13 දින අළුයම පිටවූයේ පුත්තලමේ වෙසෙන මිතුරෙකුගේ ගෙදර යාමටය. එහි ගියපසු චූටිදූව හඬමින් ආපසු එනලෙස ඇවිටිලි කිරීම නිසා දෙදිනකට පසු ආපසු ආවෙමි.

## දෙවන වරට ගෙදර හැර යාම

වසර 2011 වනවිට ඇගේ නින්දා අපහාස, උපහාස උච්චතම අවස්ථාවට පැමිණ ඇත. එබැවින් ටික කලකට හෝ නිවසින් පිටවීම සුදුසු යයි සිතුනි. චූටි දූවට සහ පුතාට ඒ බව පවසා 2011 ජනවාරි 23වැනිදා මගේ පාසැල් සමයේ මිතුරෙක් වන ව.නා.කුමාරසේනගේ ගෙදරට (මාතර දික්වැල්ලේ) ගියෙමි. එහි සිටි තුන්වැනි දිනයේ මට විරුද්ධව චෝදනා රැසක් ආරක්ෂක අමාත්‍යාංශයට සහ තවත් තැන් වලට ඉදිරිපත් කර ඇති බව දැනගන්නට ලැබුනෙන් ආපසු ආවෙමි. නමුත් ගෙදරට නොගොස් සුදු අක්කලගෙ ගෙදර නතර වූයෙමි. පසුවදා මුල්ලේරියාව පොලිස් ස්ථානාධිපති හමුවී මෙසේ කීවෙමි.

"මට විශාල ප්‍රශ්ණයක් තියනව අවුරුදු තිහ හතලිහක ඉඳල මගෙ වයිෆ්ගෙ මානසිකරෝගයක් තියනව" කියත්ම

"ඔබතුමා නයිජීරියාවෙ හිටියද"

"ඔව්"

"අසූ තුනේදි පාස්පෝට් නැතිවුනාද"

"ඔව්"

"ඔබ තුමාට පුළුවන් නම් මාව මේ ප්‍රශ්ණෙන් ගලවල දෙන්නකො"

මා තුශ්නීම්භූතව "ඒ මොකද එහෙම කිව්වෙ"

"මේ මනුස්සය සතියකට දින තුන හතරක්ම මෙහෙ එනව, පැය ගණනක්ම කියවනව හැමොටම බනිනව, හැබැයි පුතාට බනින්නෙ නැහැ. මට තේරෙන්නෙ නැහැ කොහොම විසඳන්නද කියල. ලොකු තැන් වලටත් පැමිණිලි කරල තියෙනව ඒව පිළිගන්න අයත් ඉන්න පුළුවන්. "

යනාදී වශයෙන් ලොකු විස්තරයක් කළේය.
එකම පොලිස් ස්ථානයේ එකම තනතුර දැරූ නිලධාරීන් දෙදෙනෙක් එකම ප්‍රශ්ණය දෙස බලනලද පරස්පරවිරෝධී ආකල්ප දෙකක වෙනස මට මේ අවස්ථාවේ මතකයට නැගුනි.

## ආපසු ගෙදර ඒම

දෙසතියක් පමණ සුදු අක්කලගේ ගෙදර සිටියත්, චූටිදුව-තිලිනි ගෙදර එනලෙස කියමින් නිතරම ඇවිටිලි කරන්නට වූයෙන් ආපසු ගෙදර ඒමට තීරණය කළෙමි. නමුත් මගේ එකම බලාපොරොත්තුව කෙසේ හෝ අවශ්‍ය මුදල් උපයාගෙන වෙනත් පළාතකින් ඉඩමක් ගෙන නිවසක් සාදාගෙන පදිංචි වීමයි.

## ළමා හා කාන්තා අංශයේ පැමිණිල්ල

අද 2011 මාර්තු 14 වැනිදා මුල්ලේරියාව පොලිස් ස්ථානයෙන් පණිවිඩයක් ලැබිනි. ඉන් කියවුනේ 2011 පෙබරවාරි 14 වැනිදා අංක CIB-I-59/395 යටතේ ඇය විසින් කරනලද පැමිණිල්ලකට අදාල ප්‍රකාශයක් ලබාගැණීම සඳහා කොළඹ බාරොන් ජයතිලක මාවතේ ළමා හා කාන්තා කාර්යංශයේ පෙනී සිටින ලෙසය. නමුත් පුතාගේ බලකිරීම මත එම පැමිණිල්ල ඉල්ලා අස්කරගත් බව දැනගන්නට ලැබිනි. නමුත් ඒ බව මට දන්වා නැති බැවින් නියමිත දිනයේ මා එහි ගියෙමි. එහිදී ඔවුන් කියා සිටියේ එය ඇය විසින් ඉල්ලා අස්කරගෙන ඇති නිසා අනවශ්‍ය බවය.

## මා කෙරෙහි පුතාගේ සිත බිඳවීම

අද 2011 අප්‍රියෙල් 26 දින රාත්‍රි 9ට පමණ කුසුම් විසින් පුතාට මෙසේ කියනු මට පැහැදිලිවම ශ්‍රවනය විය. "පුතේ තාත්ත ළඟ මේ දොරේ (පුතාගෙ කාමරයේ දොර) යතුරක් තියනව. දොර වහල ගියාට මදි, කබඩ් එහෙම ලොක් කරල යන්න එළියට යනකොට. " මා කෙරෙහි පුතාගේ සිත බිඳවන්නට තරම් දුශ්ට චේතනාවක් ඇගේ සිතෙහි කැකෑරෙමින් පවතින බව මෙයින් මනාව පැහැදිලි වෙයි. පසුගිය මාස කීපය තුල පැවති ඇගේ මානසික රෝගී තත්වය දැන් පහව ගොස් ඇති බැවින්, මෙය ඊට සම්බන්ධ කළ නොහැකිය. මුළුමනින්ම ඇගේ හිතේ පවතින දුශ්ය චේතනාව මින් නිරූපනය කරයි.

## මට වැරදුන තැන

අද 2012 ජනවාරි 23:- මට වැරදුනේ කොතැනද යන්න හරිහැටි අවබෝධ වුනේ වැරදී වසර තිස් ගණනකට පසුවය. මෙය කියවන ඕනෑම කෙනෙකුට ඵලප්‍රයෝජනයක් ලැබීම සඳහා එය මෙසේ සනිටුහන් කරමි. මෙය කියවන ඔබටත් මෙවැනි වැරදීම් සිදුවිය හැකිය. එසේ නම් වැඩ වැරදී දුක් විඳීමට පෙර එය නිවැරදි කර ගන්න. දැන් ප්‍රමාද වැඩියි යන හැඟීම එනතෙක් බලා සිටින්න එපා!! මෙය ආදර්ශයක් කරගන්න.

"මා හොඳින් සිටී නම් අවංකව කටයුතු කරයි නම් ඒ ගැන කාටවත් ප්‍රශ්ණයක් නැත. ඒ බව කාටවත් කියයුතු නැත, ඇඟවිය යුතු නැත, බිය වියයුතු නැත. " ඒ මා මෙතෙක් දැරූ ආකල්පයයි. එය වැරදි බව මට දැන් පැහැදිලි වේ. නමුත් දැන් එය නිවැරදි කළ නොහැකිය. ඊට ප්‍රමාද වැඩිය.

**ඔබ හොඳින් අවංකව ජීවත් වෙන්න. ඒ බව අන් අයටත්දැනගන්නට ඉඩ හරින්න.**
**අන් අය වපරැසින් බලන අවස්ථාවන් ප්‍රදර්ශණයට ඉඩ නොතබන්න.**
**එවිට අනවශ්‍ය ප්‍රශ්ණ පැන නොනගී.**

## විශ්‍රාම වැටුප අහිමි වීම

මා සමග එකම දිනයේ ගුවන් ගමන් පාලක තනතුර ලබාගත් කෙනෙක් අද (2012 දී) රු 40,000 ක විශ්‍රාම වැටුවක් ලබා ගනී. මට එය අහිමි වූයේ කුසුම්ගේ ඉල්ලීමට අවනත වී ඉල්ලා අස්වී නයිජීරියාවට ගිය නිසාය.

**<u>රේස් දැමීම</u>**

මට ස්ථිර ආදායමක් නොමැති බැවින් පසුගිය කාලයේ අන්තර්ජාලයේ ඇති නොයෙක් ආදායම් මාර්ග පිළිබඳව සොයාබැලුවෙමි. මේ අතර ඔට්ටු දැමීම සඳහා වෙන්වූ සමහර වෙබ් අඩවි කීපයක්ද, කොළඹ කොටස් වෙළඳපොලද, විදේශ විනිමය සඳහා වූ Forex Trading (Forign Exchange Trading) වෙබ් අඩවිද මගේ අවධානයට යොමු විය. Forex Trading මගින් සුළු ආදායමක් ලැබියහැකි බැවින් තවදුරටත් කරගෙන යමි.

මේ පිළිබඳව කුසුම් විසින් මා රේස් දමනවා යයි බොරු ගොතා ප්‍රචාරය කරන බව මට දැනගන්නට ලැබී ඇත. ඔට්ටු දැමීමෙන් කිසි විටකත් ආදායමක් නම් ලැබිය නොහැකි බව මම හොඳාකාරවම දනිමි.

**2013 ජනවාරි 22 :-**

අද මගේ නංගී කී කතාවක් මෙහිලා සඳහන් කිරීම සුදුසු යයි සිතමි.

කුසුම් විසින් ළඟදී දිනක නංගි අමතා මෙසේ පවසා ඇත.

**හෝමාගම වෙසෙන තම ස්වාමියා මිය ගොස් ඇති කාන්තාවක් දුරකථනයෙන් අමතා ක්‍රෙඩිට් කාඩ් පතක් මාවෙත එවීම සඳහා මගේ ලිපිනය කුසුම්ගෙන් විමසා ඇත.**

මෙම කතාව මුළුමනින්ම මනෝ විකාරයෙන් ගොතන ලද්දකි. මා දන්නා හඳුනන කාන්තාවක් හෝමගම ප්‍රදේශයේ නැත. කිසිම කෙනෙක් සමග ක්‍රෙඩිට් කාඩ් ප්‍රශ්ණයක් මට නැත.

**2013 මැයි 12**

මීට දින කීපයකට පෙර චූටි දුව-තිලිනි මා අමතා ඇගේ සෙරෙප්පුවක තෙල් වර්ගයක් ගැල්වී ඇති බව කීවාය. නමුත් ඊට හේතුව සිතාගත නොහැකි විය.

අද මැයි 12 වැනිදා උදේ 6ට පමණ පෙරකී දේම සිදුවී ඇති බවත් රාත්‍රියේ නින්දේ පසුවන විට ශබ්දයක් ඇසී අවදි වූ බවත්, එවිටම අම්මා, කාමරයෙන් පිටවෙනු දුටු බවද පැවසුවාය. එම සෙරෙප්පුව නහයට ළං කළවිට මස්වල ගන්ධයක් ඇති බව දැනුනි.

ඉන්පසු මා මගේ කාමරයට පැමිණ, මගේ ඇඳ ළඟට ගියවිට යම් දියරයක් පෑගුනි. එහිද පෙරකී ගන්ධයම පැවතුනි.

මීට පෙර දින සමරතුංග මහතා (අපේ නිවසට පිටුපස නිවස) අළුත් මොඩෙම් උපකරණයක් (Modem for internet ADSL connection) ඔහුගේ පරිගනකයට සවි කිරීම සඳහා මට භාර දී තිබුනි. එය පරීක්ෂා කිරීම සඳහා පුතාට (ගෞරික) දුනිමි. එය පරීක්ෂා කළ ඔහු 11 වැනිදා රාත්‍රියේ මගේ මේසය මත පොලිතීන් මල්ල සමගම තබන ලදී. පසුවදා උදේ 8ට පමණ සමරතුංග මහතාගේ නිවසට ගොස් එය බෑග් එකෙන් පිටතට ගත්විටම මගේ අතේ යම් දියරයක් තැවරුන බැවින් නහටට ළං කළවිට පෙරකී ගන්ධයම ඇති බව දැනුනි.

මේ සියල්ල කුසුම්ගේ විකාර වැඩ බව ඉතා පැහැදිලිය.

**2013 ඔක්තෝබර් 17**

අද දහවල් මුල්ලේරියාව පොලිස් ස්ථානයෙන් මට පණිවිඩයක් ලැබුනි. ඉන් කියවුනේ කුසුම් විසින් ගොනුකරනලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා මටත් පුතාටත් (ගෞරික) චූටිදුවටත් (තිලිනි) පොඩිඅක්කටත් (මංගලිකා) හෙට උදේ 10ට මිරිහාන පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසය.

**2013 ඔක්තෝබර් 18**

ඉහත කරුණ සම්බන්ධයෙන් අප මිරිහාන පොලිසියට ගොස් ජ්‍යේෂ්ඨ පෙලිස් අධිකාරිතුමා හමුවීමු. මෙම පමිණිල්ල ඇය විසින් පොලිස්පති තුමාට ඉදිරිපත් කරනලද බව දැනගන්න ලැබුනි.උදේ 10ට එහි ගිය අපට පැය තුනක් හිටගෙන සිටීමට සිදුවිය. වාඩිවීමට තැනක්වත් නොතිබුනි. ටික වෙලාවක් බිම වාඩිවී සිටියෙමි.

කුසුම් විසින් අමූලික බොරු රාශියක් ඉදිරිපත් කර තිබූ අතර ඒ එකකටවත් නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට මට ඉඩ නුදුනි. මා බලෙන් මෙන් කථා කළවිට ඔහු ඊට බාධා කරමින් ප්‍රකාශ කළේ මින් පසු මෙවැනි පැමිණිල්ලක් ලැබුනොත් මාව රක්ෂිත බන්ධනාගාරගතකර උසාවියට ඉදිරිපත් කරන බවය.

ඉන් පැහැදිලි වන්නේ ඇගේ මානසික රෝගී සහ මානසික විකෘතිභාවය අවබෝධ කර නොගෙන ඇයගේ බොරු ප්‍රකාශයට රැවටී ඇති බවය. ඇගේ ප්‍රකාශයේ එක්තැනක මෙසේ සටහන්කර තබුනි. "අපි

නයිජීරියාවේ ඉන්න කාලෙ මම චූටි දුවත් එක්ක එක කාමරයක නිදා ඉන්නකොට මේ මිනිහ වෙන ගෑණියෙක් එක්ක අල්ලපු කාමරේ අනාචාරයේ යෙදුන දවස් හතරක්ම" මෙවැනි සුරංගනා කථා පිළිගන්න තරම් මෝඩ දුශ්ට මිනිසුන්ට උසස් තනතුරු දීමෙන් මේ රට තව තවත් අසාදයට යාම වැලැක්විය නොහැකි බව පැහැදිලිය.

(මින් පෙර අවස්ථා දෙකකදීම පොලිස් නිලධාරීන් මෙවැනි අවස්ථාවලට මුහුණදුන් නමුත් ඔවුන් සත්‍ය අවබෝධ කරගැණීමට තරම් බුද්ධිමත් විය. )

ඇගේ පමිණිල්ල 2013-10-15 දින අංක WCIB-196/261 යටතේ පිටු 12 කින් යුතුව සටහන්කර තිබුනි. අප හතරදෙනාගේ කටඋත්තර 2013-10-18 දින WCIB-276/327 යටතේ සටහන් කරන ලදී.

එක වාක්‍යයකින් සමන්විත වූ මගේ පිළිතුර මෙසේවිය. "මෙහි සඳහන් චෝදනා සියල්ල අමූලික බොරු වන අතර, මට අවශ්‍ය වනුයේ, මනස අවුල්වී ඇති ඇයට ප්‍රතිකාර කර සුවපත් කරනු හැර ඇගෙන් වෙන්වීම නොවේ. "

## <u>3වැනි වරට සමාව ගැණීම</u>

### 2014 ජනවාරි 15

අද මාගේ ජීවිතයේ සුවිශේෂී දිනයක් ලෙස සැලකිය හැකිය.

අද උදේ කුසුම් මා ළඟට පැමිණ දෙපා ළඟ වැඳවැටී **"අනේ විජේ මට සමාවෙන්න. මෙච්චරකල් මං ඔයාට ගොඩාක් වැරදි කළා. ඒ හැම එකකටම මට සමාවෙන්න. අද දුරුතු පෝය දවසෙ මට සමාව දෙන්න.** " යයි කියමින් සිප වැළඳ ගත්තාය. මීට පෙරද කීප වරක්ම සමාව අයැද සිටියත්, මෙවර ඒ සියල්ලටම වඩා විශේෂත්වයක් දක්නට ලැබිනි. මෙවර පෙර මෙන් රැවටිල්ලක් නොවන බව මගේ විශ්වාසයයි. <u>**දසවසරකට පමණ පසු ඇගේ ඇඟට අත තැබුවේද අදයි.**</u>

**මේ අනුව හතලිස් වසරක් තිස්සේ මගේ මනසේ හොල්මන් කරමින් තිබූ සියල්ල ඉවත් කරගෙන සිත නිදහස් කරගත හැකි යයි, මට තරමක විශ්වාසයක් ඇතිවිය.**

### 2014 ජනවාරි 27

ඇගේ ආදර සැලකිලි කිසිම දිනක මා බලාපොරොත්තු නොවූවිරු තරම්වන අතර 1968/69 කාලයේ සරසවි ජීවිතය සිහියට නංවයි. නමුත් ඒ සියල්ලෙහි අනිත්‍යභාවය අවබෝධ කරගෙන සිටින මා ඒ සියල්ල උපේක්ෂාසහගතව භුක්ති විඳිමි.

### 2014 නොවැම්බර් 14

පසුගිය මාස දහයක් තිස්සේ ඇය ඉතා හොඳින් ආදරයෙන් ගෞරවාන්විතව හැසිරුන නමුත් අද ඇතිවූ සිද්ධියක් නිසා මට හැඟෙන්නේ ඇය බැටළු හමක් පෙරවාගෙන සිටින ව්‍යාඝ්‍රයෙක් බවයි.

අද රාත්‍රි ආහාරයෙන් පසු මා වෙත පැමිණි ඇය

"කෑම මේසය උඩ වතුර හැලුවෙ කවුද?" යනුවෙන් බොහොම තරහෙන් මගෙන් විමසීය.

"මම දන්නෙ නෑ" යයි කීවිට

"මගෙ වතුර කෝප්පෙ මේසෙ උඩ තිබුන, ඒක අඩුවෙලත් නෑ එහෙනම් භූතයෙකුගෙ වැඩක් වෙන්න ඇති" කියමින් මට තව තවත් දොස් පවරන්නට විය.

"වතුර හැලිච්ච විධියෙන් වැඩක් නෑ මේසරෙද්ද අයින් කරල වේලෙන්න දාන්න" යයි මා කීවත් එය ගනනකට නොගෙන තවතවත් කියවන්නට විය.

ඊයේද යම්කිසි සුළු සිද්ධියක් සඳහා මට දොස් පවරන්නට විය. නමුත් එම සිද්ධිය මට මතක නැත.

පසුගිය සතියේද බොරු වැරැද්දක් ගෙන මට දොස් පැවරීය. එයද මා එතරම් ගනන් නොගත්තද, එයද සැලකියයුතු එකක් බව දැන් සිතාගත හැකිය.

එම සිද්ධිය මෙසේයඃ- උදේ 8ට පමණ ඇගේ කාමරයේ දොරළඟ කිරිතේ ටිකක් හැලී ඇති බව මට පෙන්වා එය කාගෙ වැඩක්දැයි චෝදනාත්මක ස්වරයෙන් මගෙන් විමසීය. "වෙච්ච විධියෙන් වැඩක් නෑ, ඕක දැක්ක නම් කරන්න තියන්නේ සුද්ධ කරල දාන එකයි." යනුවෙන් පැවසූ මම එය පිරිසිදු කළෙමි. (මට දැන් හිතෙන්නේ බිම කිරි හැලීමත් මේසය මත වතුර හැලීමත් ඇය විසින්ම සිදුකර ඇති බවයි.)

### 2014 නොවැ. 22

අද මා අසලට පැමිණි ඇ මෙසේ පැවසීය.

"විජේ මට ඔයාගෙන් එක ඉල්ලීමක් කරන්න තියෙනව"

“ඒ මොකද්ද?”
“ ඔයා ගුප්ත දේවල් කරල මගෙ ඇඟට එක එක භූතයින්ව ආරූඪ කරන්න එපා”
“මම කවදාවත් එහෙම දේවල් කරලත් නැහැ. ඒව මම විශ්වාස කරන්නෙත් නැහැ .......
....ඔයා ඔය හිතින් මවාගන්න දේවල්.... බොරු කතන්දර ගොතන්නෙ නැතුව ඉන්න” යනුවෙන් මම කීවෙමි.

## සසර ගමණ

අවුරුදු හතලිස්පහක අතීතය ගැන කල්පනා කරනවිට මට හැඟීයන වැදගත් කරුනක් ඇත. අද මම එදාට වඩා ඉතා උසස් මානසික මට්ටමකට ළඟාවී ඇති බව මගේ අදහසයි. ඒ සඳහා මට උපකාරීවූයේ අන් කිසිවක් නොව කුසුම්ගේ පහත් ගති පැවතුම්ය. ඒ සඳහා ඇයට මම පින් අනුමෝදම් කරමි. අනේකවාරයක් ස්තූති කරමි. එදා ඇගේ පහත් ක්‍රියාවන් ඉදිරියේ මගේ සිත ද්වේශයෙන් කැකෑරුන අවස්ථා තිබුනි. නමුත් අද, ඇය මට කොතරම් නින්දා අපහාස කළත්, ඒවායින් මගේ සිත චංචල නොවේ.
අනුන් ඉදිරියේ මට නින්දා අපහාස කිරීම නම් තවමත් අඩුවක් නැත.

කුසුම්!!! ඔබ නිසා මගේ සසර ගමණ දැනටමත් බොහෝ කෙටිවී ඇත.!!!

**2015 අගෝස්තු 20**

අද උදේ කුස්සියේ සින්ක් එක, මම සබන් යොදා හොඳින් පිරිසිදු කළෙමි. ඊට පැය බාගයකට පමණ පසු කුසුම් මා අමතා සින්ක්එක උඩ වීදුරු කැබැල්ලක් තිබෙන බව කීවාය. මා වහාම ගොස් බැලූවිට අඟල් 2ක් පමණ දිග අඟල් තුන්කාලක් පමණ පළල වීදුරු කැබැල්ලක් පෙනෙන්නට තිබුනි. එය වතුර බොන වීදුරුවකින් කැඩුන කැබැල්ලක් වියහැකි බව පෙනුනි. එවැන්නක් එහි තිබිය නොහැකි බව මම තරයේම විශ්වාස කරමි. එය ඇය විසින් විකෘති මානසිකත්වයකින් කරනලද ක්‍රියාවක් බව පැහැදිලිය.

**2015 අගෝස්තු 26**

අද උදේ පාන්දර කුස්සියේ දොර විවෘත කරනවිටම මා දුටුවේ ළිඳ අසල රත්කෙහෙල් පඳුරෙහි හොඳින් වැඩී තිබූ ගස් තුනම බිමට පෙරලී ඇති බවය. කුස්සියට පැමිණි කුසුම්, ඊයෙ රාත්‍රි තද සුළං තිබුනේදැයි මගෙන් විමසීය. ඒ බවක් මා නොදන්නා බව කීවිට, “සුළඟට නම් ඔය ගස් තුනම වැටෙන්න විධියක් නෑ” යනුවෙන් කීවාය. ඉන් පැහැදිලි වන්නේ එය මා විසින් කරනලද ක්‍රියාවක් බව ඇය තීරණය කර ඇති බවය.
කෙසේ වෙතත් අදම මා විසින් වලවල් දෙකක් හාරා ඉතා අපහසුවෙන් ගස් දෙකක් සිටවූයෙමි. අනෙක හෙටට කල්දැමීමි.

**2017 සැප්තැම්බර් 9**

මම ටික කලක සිට භාවනාව සඳහා දිනපතාම පැයක් පමණ වෙන්කර ගතිමි. ඒ අනුව දිනපතාම රාත්‍රි නින්දට පෙර ටික වේලාවක්ද, සතියේ දිනවල අළුයම 5 සිට 5.30 දක්වාත් සති අන්තවල 5 සිට 6.30 දක්වාත් ආනාපාන සති භාවනාව සහ මෛත්‍රී භාවනාවත් කරමි. මේ අනුව මාගේ සෞඛ්‍ය තත්වයද හොඳ අතට හැරෙමින් පවතී.
අද උදෑසන 5.30 ට පමණ ඇය මා අසලට පැමිණ මෙසේ කීවාය.
“මතුරල ඉවර නැද්ද? ”
“මතුරනව නෙමෙයි මම භාවනා කරනව”
“මං දැන් දවස් ගානක්ම බලා හිටිය පාන්දරින්ම මූන හෝදගෙන ඔලුවෙ හිටන් රෙද්ද පොරවගෙන කරනවැඩේ. අන්තිම කාලෙවත් මට හොඳින් ඉන්න දෙන්නෙ නැද්ද ඔය ගුප්ත දේවල් කරන්නේ නැතුව..... ”

තවත් මොනවාදෝ කියමින් නික්ම ගියාය. නැවතත් ඇගේ මානසික තත්වය අවුල් වීගෙන එන බව මට පැහැදිලි විය.

**2017- ඔක්තෝබර්-1**

ළිඳෙන් වතුර පොම්ප කිරීම සඳහා විදුලි වතුර පොම්පයක් සවිකළ මම, ජලනල පද්ධතියේ යම් යම් වෙනස්කම් කීපයක්ද කළෙමි. මේ අතරතුර, කුසුම්ගේ කාමරයේ එක් බිත්තියක් උඩට වතුර ස්වල්පයක් වැටීම නිසා බිත්තියේ සුළු පැල්ලමක් පෙනෙන්නට තිබුනි. චූටි දුවටත්, පුතාටත්, වෙනත් පිටස්තරයින්ටත්, ඇය විසින් මෙය පෙන්වූයේ යම් සැකයක් තම සිතතුල ඇතිකර ගනිමිනි.

**2017-ඔක්තෝබර් 12**

සති කීපයක සිට නොකඩවා ඇදහැලෙන වර්ෂාව නිසා වර්ෂාපතනමානයක් සෑදීමට මට සිතුනි. ඒ අනුව ඊයේ මා විසින් මිදුලෙහි එළිමහන් පෙදෙසෙහි සිටවූ අඩි පහක් පමණ උසැති ලී කොටයක් මත පිරිසිදු සැමන් ටින් එකක් තැබුවෙමි.

අද සවස 5ට පමණ එයතුල මිමී. 10ක් පමණ වතුර තිබුනි. සැන්දෑවේ 6ට පමණ ගොස් පරීක්ෂා කළවිට දුටුවේ එය හිස්ව පවතින බවය. මෙය යම්කිසි ගුප්ත විද්‍යා ක්‍රියාවක් බවට ඇය විසින් සැක ඇති කරගෙන සිටින බව ඉන් පැහැදිලිය.

**2018-ජනවාරි 4**

අප නිවසෙහි පිරිත් පිංකමක් කිරීමට යෝජනා කළ කුසුම්, ඊයෙ උදේ හාමුදුරුවන්ට ආරාධනා කිරීම සඳහා පන්සලට යාමට සූදානම්ව බුලත් අතක් ගෙන එන ලෙස මට කීවාය. මා ගොස් උඩුමුල්ල පැත්තේ කඩ රාශියකම සොයා බැලුවත් සොයාගත නොහැකිව පැය බාගයකට පමණ පසු ආපසු පැමිණිවිට ඇය ගෙදර සිටියේ නැත.

තනියම ගොස් හාමුදුරුවන්ට ආරාධනා කිරීම ගැන මා දොස් පැවරුවිට උණුසුම් කතාවක් ඇතිවිය. පෙර පරිදිම අමූලික බොරු චෝදනා කරමින් මට ඉතා පහත් අන්දමින් බැනවදින්නට විය. 2014 දුරුතු පොහෝ දින (ජනවාරි 15) පැවසූ සියල්ල බොරු ප්‍රෝඩාවක් බව පැහැදිලිය. දිනපතාම දුරකථන ඇමතුම් 25ක් 50ක් පමණ ගනිමින්, මට සහ මගේ ඥාතීන්ට දෝශාරෝපනය කරනු නිතර ශ්‍රවනය විය.

පිරිත් පිංකම 2018 පෙබරවාරි 3වැනි දින රාත්‍රි පැවති අතර පසුදින හීල් දානය පැවතින. පසුගිය මාසයක පමණ කාලය තුල මම, ඇය සමග වචනයක්වත් කථා නොකළෙමි. පිංකම කෙසේ වෙතත් පවුකම් රාශියක්ම ඇය විසින් කරගන්නා ලදී.

**2018 මාර්තු 25**

අද දහවල්, ආදී ආනන්දීය ගුරු සංගමයේ කාරකසභික රැස්වීමේ සිටියදී මිරිහාන පොලිසියෙන් ඇමතුමක් ලැබුනි. මගේ භාර්යාාව විසින් කරනලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා අද සවස 4 ට පැමිණෙන ලස මට දැනුම් දෙන ලදී. ඒ අනුව මා එහි ගිය අතර කුසුම් සහ පුතාද, පැමිණියහ.

ඇතුල් වනවිටම, එහි සිටි නිලධාරි මහතාට ලැබුන රාජකාරී ලිපියක් මට පෙන්වීය. එහි සඳහන්ව තිබුනේ, කුසුම්ගේ පැමිණිල්ල විභාග නොකිරීම පිළිබඳව ඇය නැවතත් පැමිණිලිකර ඇති බැවින් එය වහාම විභාග කරන ලෙසය.

ඇය පැමිණිලි කර ඇත්තේ මා නිතරම ඇයට හිරිහැර කරන බවය. තවත් නොයෙකුත් අමූලික බොරු චෝදනා තිබුනි. මගේ කටඋත්තරයේ මෙසේ සඳහන් කළෙමි. 1984 න් පසු ( කාලීයක්ෂ ආරුඪය බලන්න) කිසිම අයුරකා හිරිහැරයක් ඇයට සිදුකර නැති බව සඳහන් කළෙමි.

2018 අප්‍රියෙල් 18

අද දවල් මා ආහාර ගන්නාවිට මා අසලට පැමිණි ඇය, මා, ඇයට අනවින හූනියම් කරන බවට චෝදනා කරන්නට විය. මා ඒවා විශ්වාස නොකරන බවත් කියමින් **<u>මෙතෙක් කල් මුනිවත රකිමින් සිටි</u>**

<u>මම</u>, පසුගිය වසර තිහක පමණ කාලයක් තුල ඇය විසින් කරනලද  අත්භූත දේවල් සහ මගේ කාමරයෙන් සොරකම් කරනලද  දේවල්  එකිනෙක මතක් කර දුනිමි.  ඒවා නම්

1. වරක් මගේ පරන ඇන්ටෙනා කනුව කරකැවීම සඳහා මා නිතර අල්ලන ස්ථානයේ කුණු ගඳ සහිත තෙල් වර්ගයක් තවරා තිබුනි.
2. එදිනම මගේ කාමරයේ දොරේ හැඬල් එකෙහි එම තෙල් තවරා තිබුනි.
3. දිනක් උදේ ඇඳෙන් බසිනවිට තල ඇට රාශියක් පෑගුනි. කාමරය පුරාම විසිරී තිබුනි.
4. චූටිදූවගේ සෙරෙප්පුවක මස් ගඳ සහිත තෙලක් තවරා ඇති බව එක් උදෑසනක දැනගත් අතර පෙරදින රාත්‍රියේ හදිසියේ අවදි වූවිට, අම්මා ඇගේ කාමරයේ සිට පිටවනු දුටුබව චූටිදූව මා සමග කීවාය.
5. එදිනම මගේ ඇඳ අසල බිම එම තෙලම තවරා තිබුනි.
6. ඊට පෙර දින රාත්‍රියේ මගේ මේසය මත පොලිතීන් බෑගයක් තුල තිබූ, සමරතුංග මහතාගේ මොඩෙම් උපකරණය පුරාම එම තෙලම වත්කර තිබුනි. (එය පරීක්ෂා කිරීම සඳහා මට දී තිබුනි)

පසුව ඇය විසින් මගේ කාමරයේ තිබූ රුපියල් පනස්දාහකට (50,000/-) වැඩි වටිනාකමක් සහිත භාණ්ඩ රාශියක් වරින්වර හොරකම් කර බෝතල් කාරයින්ට විකුණූ බවද, මතක් කර දුන් විට ඇය නිශ්ශබ්දවිය.

**2018 මැයි-1**

පසුගිය සතිය තුල කීපවරක්ම මා අසලට පැමිණ දනගසා වැඳ සමාව අයැද සිටි නමුත් මම නිහඬ වූයෙමි. අද මම මෙසේ කීවෙමි. "දැනට මම හත්සැරයක් ඔයාට සමාව දීල තියනව. අද මම සමාව දෙන්නෙ අන්තිම වරටයි. මින්පසු කවදාවත් මගෙන් සමාව ඉල්ලන්න එපා! "

**2018-අගෝස්තු 24**

අද මා අසලට පැමිණි කුසුම්, මම ඔයාගෙන් ප්‍රශ්ණයක් අහන්නද යනුවෙන් කියා, පිරිත තිබූ දවස් වල ඇගේ රන් මාලයක් පුතාගේ මේසයේ ලාච්චුවක තැබූ බවත් එය අතුරුදහන්ව ඇති බවත් කීවාය. මම ඒ ගැන කිසිවක් නොදන්නා බව කීවෙමි. නමුත් ඒගැන මට චෝදනා කරන්නට විය.

පුතා ගෙදර පැමිණි වහාම ඒ ගැන මා කීවිට, සොයා බලා, එය වෙනත් තැනක තිබෙනබව කියා, ඇයට දෙන ලදී.

<u>සසර පැතුම</u>

මතු සංසාර ගමනේ කිසිම විටක ඔබ වසනා රටකවත් මට උපදින්න නොලැබේවා යන්න මගේ එකම පැතුමයි!!!

පසු දිනක මැදියම් රෑ 12.30 ට පමණ මා, මගේ කාමරයේ වැඩක් කරමින් සිටිනවිට පැමිණි ඇය සිනහමුසු මුහුනින් යුතුව මෙසේ කීවාය.

"ඔයා මාව බය කරන්න ආවට මට නින්ද ගිහින් නෙමෙයි හොඳට ඇස් ඇරගෙනයි හිටියෙ. "

"මම දැන් පැයකට වැඩිය මෙතන වාඩිවෙලයි හිටියෙ. ඔයා ඇහැරිලා කිව්වට, ඔයා ඔය හීනයක් දැකල තියන්නෙ." යනුවෙන් මම කීවෙමි. අමනුෂ්‍ය කතාවද මෙවැනිම සිහිනයක් බව ඉතා පැහැදිලිය.

2019 වසරේ දිනක් ආදී ආනන්දයීය ගුරු සංගමයේ කාරකසභික මහත්මයෙක් (වීරසූරිය මහතා) අපනිවසට පැමිණියේ, සංගමයට අදාල කරුණක් සාකච්ඡා කරනු පිණිසය. සාලයේ ඇති අසුනක වාඩිවී එක් කකුලක් පුටුපත්ත මත තබා ලිපිගොනු ටික ඔඩොක්කුවේ තබාගත්විට එතැනට පැමිණි කුසුම් "අනේ මහත්තය කකුල බිමින් තියාගන්න" යයි කීවාය. සංගමයේ කාරක සභික රැස්වීම් සෑම මසකම කාරක සභිකයෙකුගේ නිවසක පැවැත්වුනද, මට එසේ කළනොහැකි වන්නේ කුසුම්ගේ මෙවැනි ක්‍රියාකලාප නිසාය.

## <u>ප්‍රබලතම කර්ම විපාකය</u>

2019 අග භාගයේදී පමණ, දිනක් ඇය මාළහටම තේ එකක් රැගෙනවිත් "විජේ තේ එකක් හැදුව බොන්න" යයි කී විට, මා පුදුමවී ඉබේටම ඇගේ මුහුණ දෙසට ඇස් යොමුවිය. මොකද්ද මේ සිද්ධවුනේ

යයි මට පුදුම හිතුනි. පසුගිය වසර හතලිස් ගණනක් තුල මෙවැන්නක් සිදුවී නැත. සමහරවිට ඇයට සත්‍ය අවබෝධ වී ඇත. එදා සිට අද (2023) දක්වාම මේ තත්වය පවතී. නමුත් එකල, අඩුවශයෙන් මාස කීපයක්වත් සතුටින් සාමයෙන් ආදරයෙන් කල් ගතකළ බවක් මගේ මතකයේ රැඳී නැත. ඉන් මා නිගමනය කළේ, මෙම කර්ම විපාකය මා විසින් ගෙවා අවසන් කරඇති බවයි. මීළඟ භවයට ගෙනයාමට කිසිත් ඉතුරුවී නැත යන්න මගේ හැඟීමයි. මෙය මා ලද විශාල ජයග්‍රහනයක් යනු මගේ හැඟීමයි.

<u>ගරු සැලකිලි</u>

කුසුම්ගේ ගරු සැලකිලි දැන් ඉතා ඉහලින් මට ලැබේ. නමුත් ඒවා මට හුරු පුරුදු ගති පැවතුම් නොවේ. අවුරුදු 47 ක පමණ කාලයක සිට මට හුරු පුරුදු වී ඇත්තේ ඇගෙන් ලැබෙන කෲරතර පහත් ගති පැවතුම් පමණි. දැන් බොහෝ අවස්ථාවන්හි දිවා භෝජන, රාත්‍රි භෝජන සඳහා ඇරයුම් කරන අතර, බොහෝවිට තේ එක පිළියෙල කර මා ළඟටම ගෙනත් දෙයි. නමුත් ඒවා මට නුහුරු නුපුරුදු දේවල්ය. බොහෝවිට මට ඇ කෙරෙහි අනුකම්පා සහගත ආදරයක් ඇතිවෙමින් පවතී.

ඒ කෙසේ වෙතත් මේ සියල්ලෙහි අනිත්‍ය බව අවබෝධකර ඇති මම ඒවා උපේක්ෂාවෙන් භුක්ති විඳිමි. පෙර සංසාරයේ කිසියම් කර්ම විපාකයක් ලෙස ඇය මා ළඟට පැමිණියත් පසුගිය වසර හතලිස් ගණන තුල මා විසින් එම දුර්විපාක ගෙවා අවසන් කර ඇතැයි මට සිතෙයි.

**2021 නොවැ 24**

අද අපගේ 50 වැනි විවාහ සංවත්සරයයි. විවාහ සංවත්සරයක් වෙනුවෙන් කේක් කැල්ලක් කැවේ දෙවැනි වරටයි. (49 සහ 50 වැනි සංවත්සර) සමහරවිට පළමු සංවත්සරය පවත්වන්නට ඇත. නමුත් ඒ බව මගේ මතකයෙන් ගිලිහී ඇත. පසුගිය දෙවසරක කාලය සුවිශේෂයි. අවුරුදු 47 කට පමණ පසුව මුල් වරට කිසිම හැලහැප්පීමකින් තොරව ගතවීම ගැන උපේක්ෂා සහගතව සතුටු වෙමි. එය මාගේ ඉවසීමේ ප්‍රතිඵලයකි.

<u>මාගේ ප්‍රාර්ථනය</u>

මීට වසර ගණනාවකට පෙර මාගේ ප්‍රාර්ථනාව වූයේ මතු සංසාරයේ කිසිමවිටක ඔබව නැවත හමු නොවේවා යනුයි. නමුත් දැන් මම එය සංශෝධනය කරමි. මෙතැන් පටන් නිවන් දක්නා භවය දක්වා හැම භවයකම අප අඹු සැමියන් ලෙසම ආදරයෙන් බැඳේවා යනු මගේ පැතුමයි.

2022 අගෝස්තු 12 දින මගේ මුහුණුපොතේ පහත සඳහන් කවිය පලකළෙමි.

හැටහතයි එකොලහයි නමය අටවක දිනේ
මේ භවයෙ මුල් වරට ඔබව මට හමු වුනේ
පෙර සසරෙ අප පැතූ අයුරු එය සිදු වුනේ
මතුවටත් ඒ ලෙසම පතමු අපි සැම දිනේ

අද (2022-11-24) මාගේ Face book පිටුවේ පහත සඳහන් කවිය සහිතව අපගේ මංගල ඡායාරූපයද පළකළෙමි.

අවුරුදු පනහකට පෙර අදවන් දිනක
පැටඑනි පඹගාලක පෙර පැතූ විලස
අටලෝදහම ලෙස ගෙවූ ඒ අඩ ශතක
සිහිනරනුයේ හදපිරි සතුටිනි මෙලෙස

අද 2022 සැප්. 18, ලොකුදුව චතුරිකාට ඇගේ 50 වැනි උපන් දිනයට සුභපැතීමෙන් පසු කුසුම් විසින් මට රු20,000ක් පිරිනමා දුවගේ උපන්දිනය වෙනුවෙන් එය පිළිගන්නා ලෙස කී අතර එය මම පිළිගතිමි. මීට පෙරද ඇය විශ්‍රාම වැටුප් ගත් පසු මට යම් මුදලක් පිරිනැමුවද, කිසිවිටකත් මම ඒවා භාර නොගත්තේ, ඒවා යහපත් සිතින් සිදුනොකළ බව මා පැහැදිලිවම දන්නා බැවිනි.

අද 2022 නොවැම්බර් 24 දින මගේ මුහුණු පොතේ පහත සඳහන් කවිය පළකලෙමි.

අවුරුදු පනස් එකකට පෙර අතීතයේ
අදවන් දිනක ආදරබර සැන්දෑවේ
පෙර පැතු විලස අප දෙදෙනා එක්වූයේ
සිහිකරනුයේ හද පිරි සතුටිනි මෙලෙසේ

අද 2023 නොවැම්බර් 24 දින මගේ මුහුණු පොතේ පහත සඳහන් කවිය සහ අප දෙදෙනගේ ඡායාරූපයක්ද අපගේ මංගල ඡායාරූපයද, පළකලෙමි.

අවුරුදු පනස්දෙකකට පෙර අතීතයේ
පෙර පැතු විලස අප එක්විය මේ භවයේ
බාධක කම්කටොලු අතරින් ගෙවී ගියේ
එනමුදු අපේ ජීවිත සතුටින්ම ගෙවේ





අවසන් වරට යාවත්කාලීන කළේ 2023 නොවැම්බර් 24 වැනිදා --ජේ.ටී.විජේරත්න--